2024
සැප්තැම්බර්

# ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය:

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයාගේ වාර්තාව

මානව හිමිකම් කවුන්සිලය

පනස් හත්වැනි සැසිය

9 සැප්තැම්බර්-9 ඔක්තෝබර් 2024

Human Rights Situation in Sri Lanka: Comprehensive report of the United Nations High Commissioner for Human Rights, September 2024.

සාරාංශය

## Contents


සාරාංශය ........................................ 2

I.**හැඳින්වීම** ........................................ 3

II. මානව හිමිකම් ප්‍රවණතා සහ වර්ධනයන් ........................................ 4

A. මානව හිමිකම් කෙරෙහි ආර්ථික අර්බුදයේ ගැඹුරුවන බලපෑම් ........................................ 5

B. ව්‍යවස්ථාදායක වර්ධනයන් සම්බන්ධයෙන් ........................................ 7

C. ප්‍රජාතන්ත්‍රවාදී තුලන සහ සංවරණ බාදනය වීම ........................................ 9

D. සිවිල් අවකාශය සීමා කිරීම් සහ පළිගැනීම් ........................................ 11

මාධ්‍යවේදීන්ට සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට තර්ජනය කිරීම ........................................ 12

E. නැගී එන සහ උත්සන්න වූ මානව හිමිකම් උත්සුකයන් ........................................ 13

1. යුක්තිය මෙහෙයුම වටා ඇති මානව හිමිකම් ගැටළු ........................................ 13

2. **සිදුවෙමින් පවතින භාරකාරත්ව මරණ, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම්, වධහිංසා පැමිණවීම් සහ ලිංගික හිංසනයන්** ........................................ 14

F. ඉඩම් තරග සහ ආගමික නිදහස සීමා කිරීම ........................................ 17

III. **දණ්ඩමුක්තිය, වගවීම සහ ප්‍රතිසන්ධානය** ........................................ 18

අ. වගවීම සහ සංහිඳියාව ........................................ 18

ආ. මුල් බැසගත් දණ්ඩමුක්තිය ........................................ 22

IV. **වගවීම වැඩි දියුණු කිරීම සඳහා තවත් විකල්ප** ........................................ 25

**නිගමන සහ නිර්දේශ** ........................................ 29

## සාරාංශය

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්ගේ විස්තීරණ වාර්තාව*


සාරාංශය

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 51/1 යෝජනාවට අනුව ඉදිරිපත් කර ඇති වර්තමාන වාර්තාවෙහි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයන අතර, මානව හිමිකම් භුක්ති විඳීමට දීර්ඝ කාලීන බලපෑමක් ඇති කළ හැකි ප්‍රවණතා කිහිපයක් ඉස්මතු කරයි. රටේ මූලික අයිතිවාසිකම් සහ නිදහස, අතීතයේ සහ වර්තමාන මානව හිමිකම් කඩකිරීම් සඳහා දණ්ඩ මුක්තිය සහ පාලනයේ වගවීම සඳහා වූ පුළුල් ඉල්ලීම් අතර සහසම්බන්ධය සටහන් කරමින්, සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ඉදිරියට ගෙනයාම සඳහා ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර ප්‍රජාව යන දෙඅංශයෙන්ම ක්‍රියාමාර්ග ගැනීම සඳහා වාර්තාව නිර්දේශ ඉදිරිපත් කරයි.


* සාමාජික රාජ්‍යය සමඟ කළ උපදේශනවල ප්‍රතිඵලයක් ලෙස වත්මන් වාර්තාව නියමිත දිනට පසුව සැකසීම සඳහා සම්මන්ත්‍රණ සේවා වෙත ඉදිරිපත් කරන ලදහ.

මෙම වාර්තාව නිල පරිවර්තනයක් නොවේ. පරිවර්තනය සුනන්ද දේශප්‍රිය විසිනි.

# I.හැඳින්වීම

1. වත්මන් වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ මානව හිමිකම් කවුන්සිලයේ 51/1[1] යෝජනාවට අනුවය. එම යොජනාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR ලෙස මෙතැන් සිට හැදින්වෙනු ඇත.) විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ, ආර්ථික අර්බුදයේ බලපෑම සහ දූෂණය විසින් මානව හිමිකම් මත ඇති කරන ලද බලපෑම  ඇතුලත් සිය අධීක්ෂණය සහ වාර්තා කිරීම වැඩි දියුණු කරන ලෙස ඉල්ලා සිටියේය.[2] 57 වැනි සැසි වාරයේදී වගවීම ඉදිරියට ගෙන යාම සඳහා වැඩිදුර විකල්ප ඇතුළත් පුළුල් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කවුන්සිලය OHCHR වෙතින් ඉල්ලා සිටියේය.[3] මෙම වාර්තාව 2022 ඔක්තෝම්බර් මාසයේදී 51/1 යෝජනාව සම්මත කිරීමෙන් පසු 2024 ජූලි දක්වා වර්ධනයන් මෙන්ම සුදුසු අවස්ථාවලදී පෙර වසරවල සිදුවීම් සම්බන්ධයෙන් වගවීම ආවරණය කරයි.

2. OHCHR වත්මන් වාර්තාව සැකසීමේදී ශ්‍රී ලංකා රජයේ මැදිහත්වීම සාදරයෙන් පිළිගනී. කවුන්සිලයේ 51/1 යෝජනාව සහ  විශේෂයෙන් OP6 සහ විශේෂයෙන් OP8 අයිතම ප්‍රතික්ෂේප කරන නමුත් මානව හිමිකම් කාර්යාලය විසින් රජයට සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට (ශ්‍රි.මා.හි.කො) ප්‍රශ්න යවා, විස්තීර්ණ ප්‍රතිචාර ලබා ගත් අතර, සත්‍ය අදහස් දැක්වීම් සහ අදහස් ලබා ගැනීම සඳහා කෙටුම්පත් වාර්තාව රජය සමඟ බෙදා ගන්නා ලදී. වත්මන් වාර්තාව සකස් කිරීමේදී OHCHR සිවිල් සමාජ පාර්ශවකරුවන් රැසක් සමඟ සෘජුවම, පුද්ගලිකව හෝ අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ විය. OHCHR හි නියෝජිත පිරිසක් 2024 ජුනි මාසයේදී වැඩිදුර උපදේශන සඳහා ශ්‍රී ලංකාවෙහි දූත ගමනක නිරත විය.

3. 2023 පෙබරවාරි මාසයේදී, ශ්‍රී ලංකාව විශ්ව කාලාන්තර සමාලෝචනයේ (UPR) සිව්වන චක්‍රයට භාජනය වූ අතර, 2023 ජූලි මාසයේදී එය ඉදිරිපත් වූ නිර්දේශ 294න් 173ක් පිළිගත්තේය.[4] UPR සහ එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන (Treaty Bodies) වැනි ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සඳහා රජය 2024 පෙබරවාරි මාසයේදී මානව හිමිකම් පිළිබඳ නව

1 A/HRC/RES/51/1, para.19
2 එම
3 එම
4 A/HRC/53/16/Add.1.

අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් පිහිටුවන ලදී. 2023 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාව සිය මූලික වාර්තාව, බලහත්කාරයෙන් අතුරුදන්කිරීම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කළේය. 2024 ජූනි වන විට, එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටි වරම දරන්නන්ගෙන් (UN special procedure mandate holders) ශ්‍රී ලංකාවට දූත ගමන් යෙදීමේ ඉල්ලීම් නවයක් ඉතිරිව තිබුණි.[5]

4. 2024 මැයි මාසයේදී, ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය (GANHRI) විසින් ශ්‍රි.මා.හි.කො නැවත 'A' තත්ත්වයට පත් කරන ලෙස නිර්දේශ කරන ලදී.[6] GANHRI සිය වාර්තාවේ, රටේ උතුරු සහ නැගෙනහිර ඇතුළුව, පුළුල් ප්‍රජාවට ශ්‍රී.මා.හි.කො. කරා ප්‍රවේශයවීම සහතික කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීම ඇතුළු නිර්දේශ කිහිපයක් සපයා ඇත.[7] 2024 ජූනි මාසයේදී, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා අන්‍යෝන්‍ය ප්‍රතිපාදන ඇතුළත් කාන්තා සවිබල ගැන්වීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

## II. මානව හිමිකම් ප්‍රවණතා සහ වර්ධනයන්

5. 2022 වසරේ සිට ශ්‍රී ලංකාව ගැඹුරු ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇති අතර, එය ගෝලීය ආර්ථික තත්ත්වය සහ දැඩි ණය පීඩාව මගින් සංකීර්ණ වී ඇත. ක්ෂනික සාර්ව-ආර්ථික තත්ත්වය ස්ථාවර වී ඇති අතර, ශ්‍රී ලංකාවේ ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා කිරීමට රජය සමත් වී ඇති අතර, එහි විපාක ජනගහනයේ විශාල කොටස්වල මානව හිමිකම් කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇත. 2022 දී මහජන විරෝධතා ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සහ දූෂණය සහ ආර්ථික අවපාලනය සඳහා වගවීම සඳහා වූ ජනප්‍රිය ඉල්ලීම් බොහෝ දුරට ඉටු වී නොමැත.[8] මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දීර්ඝ කාලයක් පසු වී ඇති විශේෂයෙන්ම ආයතනික සහ ආරක්ෂක අංශවල ප්‍රතිසංස්කරණ සිදුවී නොමැත. ඊට පටහැනිව, මෙහි විස්තර කර ඇති පරිදි, නව හෝ යෝජිත ප්‍රතිගාමී නීති සහ වින්දිතයින්ට, සිවිල් සමාජයට, මාධ්‍යවේදීන්ට සහ විවේචකයන්ට එරෙහි තර්ජන, බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වයේ අඛණ්ඩ සිදුවීම් මගින් සනාථ කෙරෙන මූලික නිදහසට නව තර්ජන ඇතිව තිබේ.

---

[5] https://spinternet.ohchr.org/Search.aspx?Lang=en.
[6] https://www.hrcsl.lk/ganhri-sub-committee-on-accreditation-recommends-that-hrcsl-be-reaccredited-with-a-status/.
[7] එම
[8] A/HRC/46/20, paras.20-23;A/HRC/51/1, paras.21–26.

6. මේ පසුබිම යටතේ මීළඟ ජනාධිපතිවරණය සැප්තැම්බර් 21 වැනිදා පැවැත්වීමට නියමිතය.[9] ඉන් අනතුරුව පාර්ලිමේන්තු මැතිවරණය 2025 අගෝස්තු වන විට පැවැත්වීමට නියමිතය. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව නොතකා 2022 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන මැතිවරණය 2024 ජූලි වන විට දිගටම කල් දැමුණු අතර 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවත්විය යුතු පළාත් සභා මැතිවරණ 2014 සිට පවත්වා නොමැත.

## A. මානව හිමිකම් කෙරෙහි ආර්ථික අර්බුදයේ ගැඹුරුවන බලපෑම්

7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික දර්ශක නංවාලීමට උපකාරී වී ඇති අතර, 2024 ජූලි මස මුල වන විට රජය සිය ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ගිවිසුම්වලට එළඹී ඇත. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදයේ සමුච්චිත බලපෑම් සහ ආර්ථික හා සමාජීය අයිතීන් භුක්ති විඳීමට අදාළ කප්පාදු කිරීමේ පියවරයන්, විශේෂයෙන්ම දුප්පත්ම සහ දැනටමත් ආන්තික කණ්ඩායම්වලට බලපාන, ගෘහස්ථ හා පුද්ගල මට්ටමින් ගැඹුරින් සහ පුලුල් ලෙස විපාක ඇති කරයි., සැබෑ වැටුප් අඩු වුවද, පුද්ගලික ආදායම් බදු සීමාව මසකට රුපියල් 100,000 (USD328) දක්වා අඩු කිරීම ඇතුළුව - IMF ඉලක්කවලට අනුකූලව තම ආදායම් පදනම ශක්තිමත් කිරීමට දැඩි මූල්‍ය පීඩනයකට මුහුණ දෙන රජය පියවර ගෙන ඇත. එමගින් පිරිවැය පරාවර්තක ඉන්ධන සහ උපයෝගිතා මිල හඳුන්වාදීම සහ එකතු කළ අගය මත බද්ද අනුක්‍රමික වැඩිවීම් සහ පුලුල් කිරීම, පහත් සමාජ-ආර්ථික මට්ටම්වල සිටින අයට සහ විශේෂයෙන් කාන්තාවන්ට බලපා ඇත.[10]

8. 2021 සහ 2023 අතර, දරිද්‍රතා අනුපාතය (USD3.65 in 2017 Purchasing Power Parity 2017 දී එය එ.ජ. ඩොලර් 3.65කි ) සියයට 13.1 සිට 25.9 දක්වා දෙගුණයක් වී ඇති අතර, ඉදිරි වසර කිහිපය තුළ එය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.[11] ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙනී යන්නේ, 2022 මාර්තු මාසයේ සිට, සියයට 60.5ක් කුටුම්භවල මාසික ආදායම අඩු වී ඇති අතර, කුටුම්භවලින් සියයට 91ක මාසික වියදම්වල

---

[9] http://documents.gov.lk/files/egz/2024/7/2394-51_E.pdf.

[10] https://www.ft.lk/opinion/Urgent-plea-by-feminists-to-address-humanitarian-crisis-caused-by-economic-collapse/14-733198; https://www.ft.lk/opinion/Universal-social-security-If-not-now-when/14-736777.

[11] https://openknowledge.worldbank.org/server/api/core/bitstreams/a498539d-ae15-4911-8895-fff713aa063a/content; https://thedocs.worldbank.org/en/doc/64a39c836b5aff415ca339ae14a1afbc-0310062023/original/Sri-Lanka-Development-Update-April-2023-final.pdf.

වැඩිවීමක් අත්විඳ ඇති බවයි.[12] ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය, ප්‍රවාහනය සහ අනෙකුත් වියදම් පිළිබඳව වඩා වැදගත් කුමක්දැයි තීරණ ගත යුතු බැවින්, ආදායම අඩුවීම (නාමික සහ සැබෑ යන දෙකම) සහ ගෘහ ණය බර වැඩිවීම බොහෝ ශ්‍රී ලාංකිකයන්ට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ඇති අයිතියට හානිකර ලෙස බලපා ඇත.

9. 2023 ජූලි මාසයේදී රජය විසින් දරිද්‍රතාවය ඉලක්ක කරගත් මුදල් හුවමාරු යෝජනා ක්‍රමයක් වන 'අස්වැසුම' හඳුන්වා දෙන ලද අතර, එය මේ වන විට පවුල් මිලියන දෙකක් වෙත ළඟා වී තිබේ. 2024 ජූලි මාසයේදී රජය විසින් නව ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියක් අනුමත කරන ලද අතර, සමාජ ආරක්ෂණය සඳහා වන වියදම් 2023 දී රුපියල් බිලියන 174 සිට 2024 දී රුපියල් බිලියන 205 දක්වා ඉහළ ගොස් ඇත.

10. ආහාර සඳහා ඇති අයිතිය සම්බන්ධයෙන්, එක්සත් ජාතීන්ගේ දත්ත ඇස්තමේන්තු කර ඇත්තේ කුටුම්භවලින් හතරෙන් එකක් පමණ මධ්‍යස්ථ ආහාර අනාරක්ෂිත බවත්, සමාජ ආරක්ෂණය සහ වෙනත් ආධාර යෝජනා ක්‍රම මත යැපෙන කුටුම්භයන් වඩාත් අවදානමටත් ලක්ව ඇති බවයි.[13] වතුකරයේ වතු ප්‍රජාවේ කුටුම්භ ප්‍රමාණවත් නොවන ආහාර පරිභෝජනය කරන අයගෙන් ඉහළම ප්‍රතිශතයක් වන බවත්, ප්‍රමාණවත් නොවන ආහාර පරිභෝජනය කරන අයගෙන් වැඩි ප්‍රතිශතයක් පිරිමි මූලික කුටුම්භ හා සසඳන විට, කාන්තා මූලික ගෘහයන් වන බවත්, ඔවුන් වඩා දැඩි මුහුණ දීමේ උපාය මාර්ග අනුගමනය කරන බවත් දත්ත පෙන්වා දෙයි (උදා: වත්කම් විකිණීම සහ ඉතුරුම් වියදම් කිරීම). 2021 සිට 2023 දක්වා කාලය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්ත පෙන්වා දෙන්නේ විවිධ වයස්වල ළමුන් ක්‍රියාශීලී වීම සහ අඩපණ වීම හේතුවෙන් පීඩාවට පත් වීමේ ප්‍රතිශතය ඉහළ ගොස් ඇති බවයි.[14] රජය, විවිධ ආහාර ආධාර වැඩසටහන් ආරම්භ කර ඇති අතර, ඒ සඳහා රු. මිලියන 3.4 ක පමණ සහල් ප්‍රතිලාභීන් අතර බෙදා හැරීම සහ සිසුන් මිලියන 1.6 ක් සඳහා පාසල් ආහාර වැඩසටහනක් ලබාදීම සඳහා 2024 දී රුපියල් බිලියන 12.7 ක් වෙන් කර ඇත.[15]

---

[12] http://www.statistics.gov.lk/WebReleases/HECS_Bulletin_Final.

[13] https://docs.wfp.org/api/documents/WFP-0000158905/download/?_ga=2.44937895.2078595437.1717510781-1011957968.1711620644.

[14] https://fhb.health.gov.lk/events/routine-nutrition-information-dashboard/.

[15] GoSL's comments on the HC's, report, 25 July 2024.

**11.** සෞඛ්‍යයට ඇති අයිතිය සම්බන්ධයෙන්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත පෙන්වා දෙන්නේ ආර්ථික අර්බුදය තුළ රෝගාතුර වූ අයගෙන් හතරෙන් එකක් පමණ අරමුදල් හිඟකම හේතුවෙන් සෞඛ්‍ය ප්‍රතිකාර ක්‍රම වෙනස් කර ඇති බවයි.[16] වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගීන්ගේ ප්‍රවේශයට බලපා ඇති අනෙකුත් තීරණාත්මක සාධක අතර සැලකිය යුතු සෞඛ්‍ය වෘත්තිකයන් සංඛ්‍යාවක් විදේශගත වීම, රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථානවලට ප්‍රවේශය අඩුවීම[17] සහ වසා දැමීම පවා, ඖෂධ හිඟය[18] සහ ව්‍යාජ ඖෂධ පිළිබඳ ගැටලු සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දූෂණ[19] ඇතුළත් වේ.

## B. ව්‍යවස්ථාදායක වර්ධනයන් සම්බන්ධයෙන්

**12.** 2023 වසරේ සිට, ආරක්ෂක හමුදාවන්ට පුලුල් බලතල ලබා දෙන සහ අදහස් ප්‍රකාශ කිරීමේ සහ සමාගමයේ නිදහස මත පවතින සීමා සැලකිය යුතු ලෙස පුළුල් කරන නව යෝජිත නීති මාලාවක් රජය විසින් හඳුන්වා දී ඇත.[20] පවතින නීති සම්පාදනයේ සමුච්චිත බලපෑම සහ මෙම නව නීති ශ්‍රී ලංකාවේ මූලික නිදහස සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගැඹුරු ඇඟවුම් ඇති කරනු ඇතැයි කනස්සල්ලක් පවතී.

**13.** වසර ගණනාවක් පුරා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයින්, OHCHR සහ ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) සහ පුනරුත්ථාපන කාර්යාංශය වැනි විවිධ මර්දන නීති සහ ජාත්‍යන්තර සිවිල් සහ සම්මුතිය (ICCPR) අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳව කනස්සල්ල පළ කර ඇත.[21] මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් අත්අඩංගුවට ගැනීමට, රඳවා තබා ගැනීමට සහ නඩු පැවරීමට ජාත්‍යන්තර දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම්

---

[16] http://www.statistics.gov.lk/WebReleases/HECS_Bulletin_Final.
[17] https://www.newsfirst.lk/2023/11/28/40-hospitals-in-sri-lanka-closed-down; https://economynext.com/despite-economic-recovery-more-sri-lankan-doctors-want-to-leave-for-better-pay-kids-future-148267/; https://www.context.news/socioeconomic-inclusion/sri-lankan-health-crisis-could-worsen-as-doctors-seek-work-abroad.
[18] https://www.dailymirror.lk/breaking-news/Patients-in-dire-straits-as-drug-shortage-hits-Govt-hospitals/108-281838.
[19] https://www.bbc.com/news/world-asia-68561893; SC/FR65/2023 (https://www.tisrilanka.org/tisl-files-fr-case-regarding-controversial-medical-supplies-procurement-through-indian-credit-line/); SC/FR99/2024 (https://www.tisrilanka.org/tisl-files-fr-petition-over-human-immunoglobulin-and-other-controversial-medical-supplies/).
[20] CCPR/C/LKA/CO/6, para.40.
[21] CCPR/C/LKA/CO/6, para.16.

ප්‍රඥප්ති පනත බොහෝ විට භාවිතා කැරේ. නිදසුනක් වශයෙන්, 2023 මැයි මාසයේදී, ICCPR පනතේ 3 වැනි වගන්තිය යටතේ, බුද්ධාගමට "අපහාස කිරීම"[22] යන චෝදනාව යටතේ නැගී එන ප්‍රහසනකාරියක වන නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගෙන රැඳවුම්භාරයට පත් කරන ලදී. මහේස්ත්‍රාත් අධිකරණය 2024 ජුනි 19 දින එම නඩුව නිෂ්ප්‍රභ කළේය.

14. 2024 ජනවාරි මාසයේදී සම්මත කරන ලද මාර්ගගත ආරක්ෂණ පනත (OSA), සහ යෝජිත නීති කිහිපයක් - ත්‍රස්ත-විරෝධී පනත් කෙටුම්පත (ATB), රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත (මින් පසු එන්ජීඕ පනත් කෙටුම්පත ලෙස දැක්වේ) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත - වැරදි පිළිබඳ නොපැහැදිලි නිර්වචන, නීති බලාත්මක කිරීමට බලධාරීන්ට ලබා දී ඇති පුළුල් බලතල, අසමානුපාතික දඬුවම්, සහ අධිකරණ අධීක්ෂණය ප්‍රමාණවත් නොවන හෝ නොමැතිකම ඇතුළු උත්සුකයන් මතු කරයි. උදාහරණයක් ලෙස, මාර්ගගත ආරක්ෂණ පනත මගින් අන්තර්ජාල අපරාධවලට එරෙහිව සටන් කිරීමට අදහස් කරන බව රජය ප්‍රකාශ කරන අතරම, එහි අත්තනෝමතික ලෙස අර්ථකථනය කිරීමට සහ බලාත්මක කිරීමට ඉඩ සලසන අපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති නියමයන් සහ වැරදි පිළිබඳ නිර්වචන අඩංගු වේ.[23] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයින් ඉදිරියේදී පිහිටුවෙන මාර්ගගත ආරක්ෂණ කොමිසමට ලබා දී ඇති බලතල ගැන කනස්සල්ල පළ කර ඇති අතර, එමගින් "විරුද්ධ හෝ සුළුතර අදහස් ප්‍රකාශ කළ හැකි හෝ රජයේ ක්‍රියාවන් විවේචනය කළ හැකි ඕනෑම අයෙකු අත්තනෝමතික ලෙස ඉලක්ක කිරීමට හේතු විය හැකි" බව දක්වා තිබේ.[24] දැනට පාර්ලිමේන්තුවේ පවතින ත්‍රස්ත විරෝධී කෙටුම්පත, රටේ ඕනෑම ස්ථානයක් "තහනම්" ලෙස ප්‍රකාශ කිරීමේ සහ ශ්‍රී ලංකා භූමියේ සම්පූර්ණ හෝ කොටස්වල ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීමේ බලය ඇතුළු සීමිත ආරක්ෂාවන් සහිත පුළුල් බලතල ද විධායකයට ලබා දී ඇත. "ත්‍රස්තවාදය දිරිමත් කිරීම" වැනි 10 වැනි වගන්තිය කථනය අපරාධයක් බවට පත් කරන නව විධිවිධාන ද එයට ඇතුළත් ය.[25]

---

[22] JAL LKA 5/2023, 26 June 2023.
[23] https://www.ohchr.org/en/press-briefing-notes/2023/10/human-rights-concerns-over-two-draft-laws-sri-lanka.
[24] OL LKA 9/2023, p.5.
[25] https://www.ohchr.org/en/documents/tools-and-resources/ohchr-preliminary-comments-sri-lankas-draft-anti-terrorism-bill.

**15.** ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතය පිළිබඳ තථ්‍ය තහනමක් ලබා දෙන බවට පොරොන්දු වුවද, සිවිල් යුද්ධයේදී මියගිය තම ඥාතීන් අනුස්මරණය කරන දෙමළ ජාතිකයන් ඇතුළු පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට බලධාරීන් එය දිගටම භාවිතා කර ඇත.[26] 2023 සහ 2024 වසර වලදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර පුද්ගලයින් පස් දෙනෙකුට රැඳවුම් නියෝග නිකුත් කර ඇති බව රජය වාර්තා කළේය. 2023 සහ 2024 (මැයි වන විට) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රැඳවියන් නව දෙනෙකු නිදහස් කර ඇති බවත්, සැකකරුවන් කිහිප දෙනෙකුට ඇප ලබා දුන් බවත් රජය පෙන්වා දුන්නේය. කෙසේ වෙතත්, ශ්‍රී.ල.මා.හි.කො. වාර්තා කළේ, 2023 ජනවාරි සහ 2024 අප්‍රේල් අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ සිද්ධීන් 46ක් පිළිබඳව බලධාරීන් විසින් දැනුම් දී ඇති බව ය. OHCHR හට එම පනත යටතේ පුද්ගලයන් රඳවා තබා ගැනීම් 12ක් පිළිබඳ වාර්තා ලැබී ඇත. අනුස්මරණ කටයුතු සංවිධානය කිරීම සඳහා සහභාගී වීම හෝ සම්බන්ධ වීම නිසා කෙටි කාලයක් සඳහා ඔවුන්ගේ නිදහස අහිමි කිරීම පිළිබඳ ප්‍රමාණවත් පිළිගැනීමක් නොමැතිව, පසුව ඇප මත මුදා හරින ලදී. නැත්නම් සති හෝ මාස කිහිපයකට පසුව නිදහස් කරන ලදී.[27]

## C. ප්‍රජාතන්ත්‍රවාදී තුලන සහ සංවරණ බාදනය වීම

**16.** 2022 ඔක්තෝම්බර් මාසයේ කරන ලද 21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විසින් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ වූ වඩාත් හානිකර ලක්ෂණ කිහිපයක් ආපසු හැරවූ නමුත්, කනස්සල්ල දිගටම පවතී. 2023 මාර්තු මාසයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි සාමාජිකයින්ගෙන් බහුතරයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන බැවින්, විධායක ජනාධිපති ධුරයට අධිකරණයේ සහ අනෙකුත් අධීක්ෂණ ආයතනවල ස්වාධීනත්වය කෙරෙහි අනවශ්‍ය බලපෑමක් කිරීමට තවමත් 21 වන සංශෝධනයෙන් ඉඩ සැලසෙන බවට සිය උත්සුකයික් ප්‍රකාශ කළේය.[28] 2024 ජනවාරි මාසයේදී, විධායක ඇඟිලි ගැසීම් පිළිබඳ නැවුම් උත්සුකයන් මතු කරමින්, ඇතැම් රාජ්‍ය කාර්යාලවලට

---

[26] E.g.: https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadPublicCommunicationFile?gId=28737.
[27] E.g.: AL LKA 1/2024.
[28] CCPR/C/LKA/CO/6, para. 5.

පත්වීම් සම්බන්ධයෙන්[29] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කෙරෙහි ජනාධිපති කාර්යාලය බලය ඉල්ලා සිටියේය. විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයට නාමයෝජනා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සහ කවුන්සිලය අතර ඇති වූ ගැටුම, 2024 අප්‍රේල් මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණයට විධායකය විසින් නාමයෝජනා දීම වළක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත් කිරීමට හේතු විය.[30] ජනාධිපතිවරයා විසින් නීතිපතිවරයාගේ ධුර කාලය විශ්‍රාම යන දිනයෙන් ඔබ්බට දෙවතාවක් දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටි අතර, එය ව්‍යවස්ථා විසින් දෙවරක් ප්‍රතික්ෂේප කරන ලදී.

**17.** නීති සම්පාදන ක්‍රියාවලියේදී ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට සහ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම ද හැල්ලු වී ඇත. මාර්ගගත ආරක්ෂණ පනත වැනි නීති කිහිපයක් සම්පාදනය කර හෝ සම්මත කර ඇත්තේ මහජනතාව, සිවිල් සමාජය ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් හෝ තාක්ෂණික සමාගම් සමඟ ප්‍රමාණවත් උපදේශනයකින් තොරව ය.[31] මීට අමතරව, විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත, එහි වැදගත්කම නොතකා, අවම මහජන අදහස් ලබා ගනිමින් 2024 මැයි මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.[32]

**18.** 2023 නොවැම්බරයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අන්තර්ජාල ආරක්ෂණ පනත් කෙටුම්පතෙහි ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට නොගැලපෙන වගන්ති 30කට වඩා වැඩි ප්‍රමාණයක් සොයා ගන්නා ලදී.[33] කෙසේ වෙතත්, 2024 ජනවාරි 24 වන දින පාර්ලිමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අවශ්‍ය වූ සංශෝධන කිහිපයක් ඇතුළත් නොකර නීතිය සම්මත කරන ලදී. පනතේ වගන්ති කිහිපයක් සහ අතපසුවීම් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට අනුකූල නොවන බවත්,[34] මාර්ගගත ආරක්ෂණ පනතට සම්මත කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කර ඇති බවත් ශ්‍රී.ල.මා.හි.කො සඳහන් කළේය. රජය OHCHR වෙත දන්වා සිටියේ

---

[29] https://pmd.gov.lk/news/performance-of-the-constitutional-duties-of-the-president-and-the-constitutional-council/.

[30] https://www.dailymirror.lk/print/front-page/Constitutional-Council-rejects-Presidents-Supreme-Court-pick/238-276192'; https://www.adaderana.lk/news.php?nid=98940#:~:text=Interim%20order%20issued%20preventing%20President%20and%20CC%20from%20nominating%20judges%20to%20SC,-April%2030%2C%202024&text=The%20Supreme%20Court%20has%20issued,Court%2C%20except%20as%20Chief%20Justice.

[31] https://aicasia.org/download/889/.

[32] http://documents.gov.lk/files/bill/2024/5/479-2024_E.pdf; OL LKA 9/2023.

[33] https://www.hrcsl.lk/wp-content/uploads/2024/02/HRCSL-Press-Notice-08022024.pdf.

[34] https://www.hrcsl.lk/wp-content/uploads/2024/02/HRCSL-Press-Notice-08022024.pdf.

තවම ප්‍රකාශයට පත් කර නොමැති නමුත් තවදුරටත් නීති සංශෝධන කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති බවයි.[35] එසේ තිබියදීත්, නව නීතිය යටතේ අපරාධ නඩු තුනක් දැනටමත් ආරම්භ කර ඇත.[36] 2024 ජූනි මාසයේදී, 'ස්ත්‍රී පුරුෂ සමානාත්මතා' පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළ විට, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී අධිකරණයට පහර දුන් අතර, එම තීන්දුව අවලංගු කිරීමට තේරීම් කාරක සභාවක් පත් කිරීමට යෝජනා කළේය. රජයේ අංශ තුන අතර මූලික ව්‍යවස්ථාමය ගැටුමක් ඉන් ඇති වූ අතර එය අධිකරණයේ ස්වාධීනත්වය අවදානමට ලක් කරයි.

## D. සිවිල් අවකාශය සීමා කිරීම් සහ පළිගැනීම්

**19.** ආර්ථික අර්බුදයේ දරුණුතම බලපෑම් ආමන්ත්‍රණය කිරීමේදී සහ ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රජාවන්ට සහාය වීමේදී සිවිල් සමාජය, ග්‍රාමීය ප්‍රදේශවල තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, ඒවායෙහි මෙහෙයුම් අවකාශය සීමා කිරීම සහ පරිපාලනමය සහ නීතිමය සීමාවන් වැඩි කිරීම මගින් සේවා සැපයීම, සංවර්ධන කටයුතු සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටීම සඳහා පරිසරය සිවිල් සමාජ සංවිධානයන්ට වඩාත් දුෂ්කර කරයි. සිවිල් සමාජ සංවිධාන 2022 ජූලි මාසයේ සිට මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට මාරු කරන ලද රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. සිවිල් සමාජ සංවිධානයන්හි ක්‍රියාකාරකම් සහ අරමුදල් මූලාශ්‍ර, බුද්ධි අංශ විසින්, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

**20.** 2024 ජූලි වන විට, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ගැටළු විසඳීම සඳහායැයි රාජ්‍ය නොවන සංවිධානයන්හි ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා රජය නව නීතියක් කෙටුම්පත් කරමින් සිටියේය.[37] රජය 2024 ජනවාරි මාසයේදී විද්‍යුත් මාධ්‍ය නියාමන පනත් කෙටුම්පතක් ප්‍රසි ධ කළ බව වාර්තා විය.[38] OHCHR විසින් කියවන ලද එම කෙටුම්පතෙහි, ලියාපදිංචිය ප්‍රදානය කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලධාරීන්ට ලබා දී ඇති පුළුල් අභිමතය සහ "ඕනෑම දේශපාලන ක්‍රියාකාරකමක" හෝ "මූලික සංස්කෘතික වටිනාකම් වලට බලපාන"

---

[35] https://www.themorning.lk/articles/1DjrRE6q5whH8b6ImfpA.
[36] https://www.dailymirror.lk/breaking-news/Army-Commander-obtains-order-against-YouTube-channel-under-Online-Safety-Act/108-282656#:~:text=The%20Colombo%20Chief%20Magistrate's%20Court,newly%20enacted%20Online%20Safety%20Act.
[37] GoSL's comments, 25 July 2024, para 42.
[38] Ibid, para 43.

ක්‍රියාකාරකම්වල නියැලීමට සීමා පනවන "රාජ්‍ය නොවන සංවිධානවල රාජකාරි" පිළිබඳ වගන්ති ඇතුළුව ගැටලුකාරී විධිවිධාන රාශියක් ඇත. මෙම ප්‍රතිපාදන අයිසීසීපීආර්[39] වැනි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ඇති හිමිකම් අවශ්‍යතා සමඟ නොගැලපේ. සමාගමයේ නිදහසට ඇති සීමාවන් සමානුපාතික සහ නීත්‍යනුකූලව අත්‍යවශය ඒවා විය යුතුය. මෙම පනතෙහි ඇති සීමාවන් සමාගමයේ නිදහසේ අයිතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ හැකිය.

### මාධ්‍යවේදීන්ට සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට තර්ජනය කිරීම

**21.** වාර්තාකරණ කාල සීමාව තුළ, OHCHR විසින් මාධ්‍යවේදීන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්, විශේෂයෙන්ම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, ඉඩම් අත්පත් කර ගැනීම්, පාරිසරික ගැටළු සහ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර හිටපු සටන්කාමීන් සම්බන්ධයෙන් නිරීක්ෂණ, බිය ගැන්වීම් සහ හිරිහැර කිරීමේ නිරන්තර ප්‍රවණතාවක් නිරීක්ෂණය කරන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID සීඅයිඩී) හෝ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ (TID ටීඅයිඩී) පොලිස් නිලධාරීන්, එම පිරිස්හි වැඩසටහන්, අරමුදල්, සිදුවීම් සහභාගිවන්නන්, කාර්ය මණ්ඩල සම්බන්ධතා සහ ජාත්‍යන්තර සංචාර පිළිබඳව නීතිමය පදනමකින් තොරව ප්‍රශ්න කිරීම සඳහා බොහෝ විට ඔවුන් කැඳවූ බව හෝ පැමිණි බව සිවිල් සමාජ සංවිධාන වාර්තා කළේය. මෙම කලාපවල මාධ්‍යවේදීන් අපවාදාත්මක නඩු, ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් සහ සෝදිසි කිරීම්වලට මුහුණ දෙයි. නිදසුනක් වශයෙන්, 2023 ඔක්තෝම්බර් මාසයේදී, මාධ්‍යවේදීන් වන පුන්නියමූර්ති සසිකරන් සහ බාලසිංහම් ක්‍රිෂ්ණකුමාර්, රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වූ ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ විරෝධතාවක් ආවරණය කිරීමෙන් පසු ප්‍රශ්න කරන ලදී.[40] 2023 නොවැම්බරයේදී, බෞද්ධ භික්ෂුවක් දෙමළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වයට තර්ජනය කරන ආකාරයේ සංස්කරණය නොකළ දර්ශන භාර දෙන ලෙස ඔවුන්ට අධිකරණ නියෝගයක් ලැබුණි.[41]

### අතුරුදහන්වූවන්ගේ පවුල්වලට එරෙහිව පළිගැනීම් සහ බිය ගැන්වීම්

**22.** වාර්තා කරන කාල සීමාව තුළ, එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාවේ සාමාජික සාමාජිකාවන් ඇතුළු ජාත්‍යන්තර ක්‍රියාකාරීන්

[39] Art.22.
[40] https://cpj.org/2023/11/two-sri-lankan-journalists-questioned-harassed-following-protest-coverage/.
[41] https://www.facebook.com/maddunews/videos/1360369847901836/?extid=NS-UNK-UNK-UNK-IOS_GK0T-GK1C&mibextid=j8LeHn.

සමග සම්බන්ධ වී සිටින අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට එරෙහිව සිද්ධීන් හයක් OHCHR වෙත වාර්තා වී ඇත. විශේෂයෙන් වින්දිත කාන්තාවන්, සීඅයිඩී හෝ ටීඅයිඩී නිලධාරීන් යැයි කියා ගන්නා පුද්ගලයින්ගෙන් රාත්‍රියේ ඇමතුම් ලැබුණු බව වාර්තා කර ඇති අතර, ඔවුන් විරෝධතාවලට සහභාගී වීම, අරමුදල් සහ ඔවුන්ට හමු වූ පුද්ගලයින් ඇතුළුව කොළඹ හෝ ජිනීවා සංචාරයන් පිළිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න කළහ.

## E. නැගී එන සහ උත්සන්න වූ මානව හිමිකම් උත්සුකයන්

### 1. යුක්තිය මෙහෙයුම වටා ඇති මානව හිමිකම් ගැටළු

23. 2023 දෙසැම්බර් මාසයේ සිට, මහජන ආරක්ෂක අමාත්‍යවරයාගේ මඟ පෙන්වීම යටතේ සහ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ගේ සහාය ඇතිව, “මත්ද්‍රව්‍ය උවදුර” පාලනය කිරීමේ ප්‍රකාශිත අරමුණ ඇතිව පොලිසිය ‘යුක්තිය’ නමින් දරුණු මෙහෙයුමක් ක්‍රියාත්මක කර ඇත.  මෙම මෙහෙයුම සඳහා හමුදා නිලධාරීන් යෙදවීම, මත් ද්‍රව්‍ය නීතිය බලාත්මක කිරීමේ ප්‍රයත්නයන් මිලිටරීකරණය කිරීමේ කරදරකාරී උත්සන්න වීමක් නියෝජනය කරයි. 2024 මැයි 20 වන විට අත්අඩංගුවට ගත් පුද්ගලයන් 121,957 න් 43,465 ක් ඇප මත මුදා හැර ඇති බව රජය වාර්තා කළේය. ඒ අනුව 8,300ක් අත්අඩංගුවේ පසුවන අතර 4,344 දෙනෙකුට අධිකරණ රැඳවුම් නියෝග නිකුත් කර ඇති අතර 3,056 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කර ඇත.

24. OHCHR වෙත ලැබී ඇති තොරතුරු අනුව, අත්අඩංගුවට ගත් බොහෝ දෙනා මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන් හෝ මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වන නමුත් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නොවේ. ශ්‍රී.ල.මා.හි.කො, නීතිඥ සංගමය සහ එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් ඇතුළු විවිධ ආයතන, ‘යුක්තිය’ සමයේ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ වධහිංසා පැමිණවීම් සහ අයහපත් ලෙස සැලකීමේ අවස්ථා සහ හමුදා විසින් පවත්වාගෙන යනු ලබන අනිවාර්ය පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සිය ගණනක් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් කනස්සල්ල පළ කර ඇත.[42] ශ්‍රී.ල.මා.හි.කො. පවසන පරිදි, මෙහෙයුම් ආරම්භයේ සිට 2024 අප්‍රේල් දක්වා

[42] https://www.hrcsl.lk/the-yukthiya-operation-press-notice-no-hrc-p-i-e-08-01-24/; https://www.hrw.org/news/2024/01/15/sri-lanka-stop-abusive-anti-drug-operation-and-release-those-arbitrarily-detained; https://www.ohchr.org/en/press-releases/2024/01/un-experts-call-sri-lanka-immediately-suspend-and-review-yukthiya-anti-drug; https://www.ohchr.org/en/press-briefing-notes/2024/01/sri-lanka-anti-drugs-operation.

වධහිංසා පැමිණිවීම් 14 ක් ඇතුළුව පැමිණිලි 60 ක් ලැබී ඇත. තවද, මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් කියැවෙන, මෙහෙයුම් අතරතුර අධික බලය යෙදවීම දිරිගන්වන බාධාකාරී වාචාල කතා සැලකිය යුතු කනස්සල්ලක් මතු කරයි.[43]

25. අත්තනෝමතික රඳවා ගැනීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම, 2017 ශ්‍රී ලංකා සංචාරයෙන් පසුව, මිලිටරිය වෙනුවට පුහුණු වෛද්‍ය නිලධාරීන් විසින් මත් ද්‍රව්‍ය ප්‍රතිකාර වැඩසටහන් කළමනාකරණය කිරීමට නිර්දේශ කරන ලදී.[44] මත් ද්‍රව්‍ය ප්‍රතිකාර වැඩසටහන්වලට හමුදාව සම්බන්ධ කර ගැනීමට අවසර දෙන නීතිමය ප්‍රතිපාදන නොමැති වුවද, බරපතල රැඳවි ගැටුමක් සමඟින් වධහිංසා පැමිණවීම්, අයහපත් සැලකීම් සහ මරණ පවා වාර්තා වූ කන්දකාඩු සහ සේනපුර වැනි පහසුකම් හමුදාව දිගටම කළමනාකරණය කරයි.[45]

## 2. සිදුවෙමින් පවතින භාරකාරත්ව මරණ, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්/පැහැරගැනීම්, වධහිංසා පැමිණවීම් සහ ලිංගික හිංසනයන්

26. ශ්‍රී ලංකාව තුළ පොලිස් සහ ආරක්ෂක අංශ විසින් වධහිංසා පැමිණවීම් සහ අයහපත් සැලකීම් තවමත් බහුලව පවතී.[46] 2023 අප්‍රේල් මාසයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ප්‍රකාශ කළේ, "අත්අඩංගුවේදී සිදුවන මරණවලට හේතු වී ඇති, රැඳවුම් ස්ථානවල පොලිසිය සහ ආරක්ෂක අංශ විසින් කරනු ලබන පුළුල්ව පැතිරී ඇති වධහිංසා සහ අයුතු ලෙස සැලකීමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැඩි කනස්සල්ලට පත්ව සිටින" බවයි.[47] ශ්‍රී.ල.මා.හි.කො, OHCHR වෙත දන්වා සිටියේ 2023 ජනවාරි සිට 2024 මාර්තු දක්වා කාලය තුළ වධහිංසා පැමිණවීම් 2,845 ක් සහ අවමන් සහගත සැලකීම පිළිබඳ පැමිණිලි 675 ක් ලැබී ඇති බවයි. පොලිසිය විසින් කරන ලදැයි කියූ අනීතික ඝාතන 21ක්, අත්අඩංගුවේ පසුවන අතරතුර එනම් භාරකාරත්වයේ මරණ 26 ක් සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ

---

43 https://x.com/lankafiles/status/1783895418843115580.
44 A/HRC/39/45/Add.2, para 56.
45 A/HRC/39/45/Add.2; https://www.dailymirror.lk/breaking_news/Two-soldiers-two-Airmen-arrested-over-Kandakadu-inmates-death/108-240225; https://www.newswire.lk/2022/11/07/president-calls-for-full-report-on-kandakadu-violence/.
46 https://www.hrcsl.lk/wp-content/uploads/2023/06/International-Day-in-Support-of-Victims-of-Torture-2023_Chairpersons-Message.pdf; CCPR/C/LKA/CO/6, para. 26.
47 Ibid., para. 26

රඳවා තබා ගැනීම් පිළිබඳ පැමිණිලි 1,342 ක් ද ලැබුන බව ශ්‍රී.ලං.මා.කො. වාර්තා කළේය. 2023 සහ 2024 දී භාරකාරයත්වයේදී මරණ සිද්ධීන් පිළිවෙළින් 14 සහ 3 ක් වාර්තා වී ඇති බවත්, භාරකාරත්ව මරණ වැළැක්වීම පිළිබඳ චක්‍රලේඛ අංක 2747/2023 පොලිසිය විසින් නිකුත් කර ඇති බවත් රජය OHCHR වෙත දන්වා සිටියේය.

27. ප්‍රධාන වශයෙන් යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවල ශ්‍රී ලංකා ආරක්ෂක අංශ විසින් දෙමළ වාර්ගික පුද්ගලයන්ට එරෙහිව සිදු කරන ලද පැහැර ගැනීම්, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම්, වධහිංසා පැමිණවීම්, අයහපත් සැලකීම් සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ මෑත කාලීන චෝදනා OHCHR විසින් විමර්ශනය කරන ලදී. මේවා 2024 ජනවාරි තරම් මෑත කාලසීමාවට අයත් වේ. OHCHR වින්දිතයන් යැයි කියනු ලබන අට දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා කළේය. එහිදී පැහැදිලි රටාවක් මතු විය: දෙමළ ජනතාව, මූලික වශයෙන් අතුරුදහන් කිරීම්, ඉඩම්/පරිසර අයිතීන් හෝ යුද්ධයෙන් විපතට පත් වූවන් සැමරීම සම්බන්ධයෙන් විරෝධතාවලට සම්බන්ධ වූ සහ මීට පෙර දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධ වී හෝ සම්බන්ධ වූ බවට විශ්වාස කරන ලද) පුද්ගලයන් නිරීක්ෂණය හෝ ඡායාරූපගත කර, පසුව පොලිස් සීඅයිඩී හෝ ටීඅයිඩී නිලධාරීන් ලෙස වාචිකව හඳුන්වා ගත් පුද්ගලයන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී. අවස්ථා කිහිපයකදී, වින්දිතයන් අතුරුදහන් වී ඇති බවට වින්දිතයන්ගේ පවුල් පොලිසියට සහ මානව හිමිකම් කොමිසමට[48] පැමිණිලි කළහ.

තවද, මෙහෙයුම් වලදී අධික බලය භාවිතා කිරීම දිරිගන්වන මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් කියැවෙන බාධාකාරී වාචාල කතා සැලකිය යුතු කනස්සල්ලක් මතු කරයි.

28. වින්දිතයන් විස්තර කළේ සවස් කාලයේ හෝ රාත්‍රියේදී නිලධාරීන් පැමිණ, ඔවුන්ගේ ඇස් බැඳ, කටවල් දමා, ඔවුන් වෑන් රථයක දමා ඔවුන් හෝ ඔවුන්ගේ පවුලේ අය නොදන්නා ස්ථානයක, ආසන්න වශයෙන් මිනිත්තු 30 සිට පැය දෙකක් අතර දුර රැඳවුම් මධ්‍යස්ථානයකට ගෙන ගිය ආකාරයයි. විදේශගතව සිටින හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයින් සමඟ ඔවුන්ගේ සබඳතා, අරමුදල් රැස් කිරීම්, විරෝධතා පිටුපස සිටින පුද්ගලයින් සහ 'එල්ටීටීඊය නැවත සංවිධානය කිරීමට' ගැන 'පාපොච්චාරණය' ලබා ගැනීමට හෝ වළ දැමූ ආයුධ හෝ මුදල් පිළිබඳ තොරතුරු

---

48 Copies seen by OHCHR.

ලබා ගැනීමට දරන ලදැයි කියන කවර හෝ උත්සාහයක් පිළිබඳව ඔවුන්ගෙන් දින තුනක් හෝ පහක් ප්‍රශ්න කරන ලදී.

29. OHCHR විවිධ වධ හිංසා සහ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමේ විවිධ ශිල්පීය ක්‍රම භාවිතා කළ ආරක්ෂක හමුදා පිළිබඳ විශ්වසනීය නිශ්චිත සාක්ෂි ලෙස ඒවා තක්සේරු කෙරේ. ප්‍රශ්න කිරීම්වලදී හෝ රැඳවුම් කුටියේදී ස්ත්‍රී දූෂණය, වෘෂණ මිරිකීම, බලහත්කාරයෙන් නිරුවත, පියයුරු සපාකෑම ඇතුළු ලිංගික වධ හිංසාවලට මුහුණ දුන් බව බොහෝ සම්මුඛ පරීක්ෂකයින් වාර්තා කළහ. වින්දිතයන් එවැනි වධහිංසා නැවැත්වීම සඳහා තොරතුරු නිර්මානය කිරීම, ව්‍යාජ 'පාපොච්චාරණය' කිරීම හෝ වින්දිතයන්ගෙන් බහුතරයකට කියවිය නොහැකි භාෂාවක් වන සිංහල භාෂාවෙන් හිස් කඩදාසි හෝ ලේඛනවලට අත්සන් කළ බව විස්තර කළේය.

30. බොහෝ විට අතරමැදියෙකු යොදා ගනිමින් තම පවුලේ සාමාජිකයෙකු ආරක්ෂක හමුදාවේ කෙනෙකුට අල්ලසක් දුන් විට අවසානයේ තමන් නිදහස් වූ බව සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වූ සියලු දෙනාම පාහේ විස්තර කළහ. පසුව ඔවුහු ලංකාවෙන් පලා ගියහ. බොහෝ අවස්ථාවන්හිදී, වින්දිතයන් පැවසුවේ, වින්දිතයා සෙවීමට හෝ වින්දිතයා තම අත්අඩංගුවේ සිට පලා ගොස් ඇති බවට පවුල්වලට දැනුම් දීමට ආරක්ෂක හෝ බුද්ධි අංශ නියෝජිතයන් වින්දිතයන්ගේ නිවසට පැමිණි බවයි.

31. OHCHR විසින් මෙම වින්දිතයින්ගේ විශ්වසනීයත්වය සහ ඔවුන් සපයන ලද තොරතුරුවල සත්‍යතාව හොඳින් තක්සේරු කරන ලදී. සාක්ෂි සවිස්තරාත්මක සහ ස්ථාවර වූ අතර ඒවා විවිධ කාලවලදී, විවිධ රටවලදී වාර්තා කර ඇත. වින්දිතයින් කිහිප දෙනෙකු පැවසුවේ OHCHR සමඟ කළ සම්මුඛ සාකච්ඡාව, ඔවුන්ගේ අත්දැකීම් ගැන කතා කළ පළමු අවස්ථාව බවය. තවද ඔවුන්ගෙන් කිහිප දෙනෙකු වෛද්‍ය සහ මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර සහ උපදේශන ලබා ගනිමින් සිටින බවයි.

32. OHCHR විසින් වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා රජයට එම සිදුවීම් පිළිබඳ දළ සටහනක් සපයන ලදී. රජය ප්‍රතිචාර දැක්වූයේ එම චෝදනාවලට ප්‍රමාණවත් විස්තර නොමැති නමුත් පැහැරගැනීම්, නීතිවිරෝධී ලෙස රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණවීම යන චෝදනා බරපතල ලෙස සලකන බවත්, ගැඹුරු විමර්ශන කිරීමට සහ නඩු පැවරීමට තමන් කැපවී සිටින බවත්ය. වධහිංසාවට එරෙහි සම්මුතිය සහ එහි විකල්ප ප්‍රොටෝකෝලය (OPCAT) ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම්

ගිවිසුම්වල පාර්ශ්වකරුවෙකු ලෙස ශ්‍රී ලංකාවට වධහිංසා පැමිණවීම තහනම් කිරීම සඳහා ශක්තිමත් නීතිමය රාමුවක් ඇති බව රජය අවධාරණය කළේය. වධහිංසාවට ලක්වූවන්ට සහන සැලසීමේදී අධිකරණයේ ක්‍රියාකාරී භූමිකාව මෙන්ම ක්‍රියාකාරීත්වය රජය විසින් ඉස්මතු කරන ලදී.

## F. ඉඩම් තරඟ සහ ආගමික නිදහස සීමා කිරීම

**33.** 2024 පෙබරවාරි මාසයේදී රජය විසින් රටපුරා 'උරුමය' නමින් වැඩසටහනක් ආරම්භ කරන ලදී.[49] උතුරු නැගෙනහිර සිවිල් යුද්ධය අවසන් වී වසර 15කට පසු ඉඩම් සම්බන්ධ ගැටුම් තවමත් මූලික ප්‍රශ්නයක් ලෙස පවතී.[50] 2022 දෙසැම්බර් සිට 2024 මාර්තු දක්වා කාලය තුළ[51] හමුදාව විසින් නැවත සිවිල් පාලනයට කඩින් කඩ ඉඩම් මුදා හැරීම් මාලාවක් සිදුවෙමින් පවතින අතර, තවදුරටත් නිදහස් කිරීමට නියමිත ඉඩම් හඳුනා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය තුළ කමිටුවක් පිහිටුවා ඇති බව රජය පෙන්වා දුන්නේය. ඉඩම් ගැටළු, කෙසේ වෙතත් භෞතික භූ තලයේ වෙනස්වීම් සහ බිම් සලකුණු විනාශ කිරීම, ද්විතියික හිමිකම් ආරවුල් වැනි වෙනත් සාධක මගින් තවදුරටත් සංකීර්ණ වේ. සමහර විට ආර්ථික කටයුතු සඳහා අඛණ්ඩව යුද හමුදා පැමිණීම සහ මුදා හරින ලද ඉඩම් අවට ප්‍රදේශ හෝ ප්‍රවේශ මාර්ග ලෙස ඇතුළුවීමේ හෝ ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා හමුදා පාලනය යටතේ පවතී.

**34.** ඊට සමාන්තරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු, සහ පොලිසිය ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක මැදිහත්වීම මත ඉඩම් ආරවුල් දිගටම ඇවිලෙමින් පවතී. වන ආවරණය සඳහා ඉඩම් වැඩි වැඩියෙන් ගැසට් කර ඇති අතර, ඒවායේ ප්‍රායෝගික භාවිතය ජනයාට සීමා කර ඇත. පුරාවිද්‍යාත්මක නටබුන් පිළිබඳ ප්‍රකාශයන් සම්බන්ධ ගැටුම් ජනවාර්ගික-ආගමික ආතතීන් උග්‍ර කර ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායන්ට බලපායි. මෙම දුක්ගැනවිලි සමහර අවස්ථාවලදී ආගමික

[49] https://pmd.gov.lk/news/urumaya-program-to-solve-land-issues-for-two-million-people-to-begin-on-05th-february/.
[50] See: A/HRC/45/45/Add.1.
[51] https://www.army.lk/news/army-used-land-padippalai-released-owners; https://www.army.lk/news/more-lands-used-security-purposes-palaly-hsz-released-civilians; https://www.army.lk/news/more-army-used-mullaitivu-lands-released-civilians; https://www.army.lk/news/more-army-used-lands-released-mullaittivu; https://www.army.lk/news/more-army-used-lands-released-civilians-batticaloa; https://www.army.lk/news/55-infantry-division-releases-more-land-kilinochchi-district-secretary; https://www.army.lk/news/sri-lanka-army-returns-over-100-acres-land-rightful-owners-jaffna-peninsula; https://www.army.lk/news/235-acres-returned-jaffna-farmers.

ගතිකත්වයන්ගෙන් ආවරණය වී ඇති අතර, සුළුතර ප්‍රජාවන්ගේ ආගමික නමස්කාරයට සහ සංස්කෘතික ජීවිතයට සහභාගී වීමට ඇති අයිතීන් කෙරෙහි බලපායි. 2024 මාර්තු මාසයේදී, වවුනියාවේ, වෙඩ්ඩුක්කුනාරි විහාරස්ථානයේ ශිවරාත්‍රී උත්සව චාරිත්‍රවලට සහභාගී වූ බැතිමතුන් අට දෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී.[52]

35. මුලතිව් කුරුන්තූර්මාලේ එවැනි එක් ආරවුලකදී, හින්දු සහ බෞද්ධ බැතිමතුන් විසින් හිමිකම් කියන ආගමික ස්ථානයේ නව ඉදිකිරීම් ඉවත් කිරීමට නියෝග කළ විනිසුරුවරයෙකු ඉන් පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා උසාවියට අපහාස කරන බවට තීන්දු කිරීමෙන් පසු[53] 2023 සැප්තැම්බර් මස ඔහුගේ ජීවිතයට තර්ජන එල්ල වී ඇතැයි[54] ඉල්ලා අස්විය. මෙම නඩුවේ නීතිමය කටයුතු සිදුවෙමින් පවතින බවත්, එම ස්ථානයේ දෙපිරිස ආගමික කටයුතු සිදුකරන බවත් රජය සඳහන් කළේය.

## III. දණ්ඩමුක්තිය, වගවීම සහ ප්‍රතිසන්ධානය

### අ. වගවීම සහ සංහිඳියාව

36. මේ වසරෙහි ශ්‍රී ලංකාවෙහි විනාශකාරී සිවිල් යුද්ධය අවසන් වී වසර 15ක් සපිරේ. එම යුද්ධ වසර 30ක කාලසීමාව තුළ ආරක්ෂක හමුදා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අඛණ්ඩව සහ බරපතළ ලෙස මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජනයන් සිදු කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය මීට පෙර තහවුරු කළේ[55] ගැටුමේදී මානව හිමිකම් බරපතළ ලෙස උල්ලංඝනය කිරීම්, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සිදු වූ බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවයි. මේ වන විට, ගැටුමේ දී සිදු වූ බරපතල උල්ලංඝනයන් පිළිගෙන හෝ වින්දිතයින්ට ප්‍රමාණවත් සහනයක් රජය විසින් ලබා දී ඇත්තේ කලාතුරකිනි. බොහෝ විට ජාත්‍යන්තර බලපෑම්වලට ප්‍රතිචාර වශයෙන්, අනුප්‍රාප්තික ආණ්ඩු විසින් පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා රාශියක්ම, සත්‍යය තහවුරු කිරීමට

---

52 https://www.hrw.org/news/2024/03/19/sri-lankan-authorities-detain-hindu-worshippers

53 https://www.tamilguardian.com/content/contempt-court-kurunthurmalai-incident-archaeological-department-official-held-accountable.

54 https://www.newswire.lk/2023/09/30/law-associations-raise-concerns-over-resignation-of-mullaitivu-judge/.

55 See: A/HRC/30/CRP.2, para.1113; Report of the Secretary-General's Panel of experts on accountability in Sri Lanka, 31 March 2011, paras.421-422 and 424.

සහ වගවීම සහ ප්‍රතිසන්ධානය විශ්වාසදායක ඉදිරියට ගෙන යාමට ලෙස අසමත් වී ඇත.[56] මෙම ගැටුම් ආශ්‍රිත අපරාධ විමර්ශනය කර නඩු පැවරීම සඳහා විශේෂ නීති උපදේශකවරයකුගෙන් යුත් අධිකරණ යන්ත්‍රණයක් නිර්මාණය කිරීමට 2015 වසරේ රජය දුන් පොරොන්දුව ක්‍රියාත්මක වී නොමැත.

37. වන්දි ගෙවීමේ කාර්යාලය (OR) විසින් දළ වශයෙන් රු. බිලියන 2.4 (ඇමෙරිකානු ඩොලර් 7,928,304) වටිනා ප්‍රධාන වැඩසටහන් තුනක් 2023 සිට 2024 ජූනි අවසානය දක්වා පවුල් 9,169 ක් සඳහා ක්‍රියාත්මක කර ඇත. මූල්‍ය සහන වැඩසටහන, ජීවනෝපාය ආධාර වැඩසටහන, මනෝ සමාජීය ආධාර වැඩසටහන යනු ඒවාය. මූල්‍ය සහන පිළිබඳ දත්ත කාන්තා මූලික පවුල් ඇතුළු ප්‍රතිලාභීන්ගේ කාණ්ඩය අනුව වෙන් කර නොමැති බව රජය, OHCHR වෙත දැනුම් දෙන ලදී.

38. ත්‍රස්තවාදය උත්කර්ෂයට නංවා නොමැති නම්, තම ආදරණීයයන් අනුස්මරණය කිරීමට අදාල පවුලේ සාමාජිකයින්ට කිසිදු සීමාවක් නොමැති බව රජය OHCHR වෙත දැනුම් දුන්නේය. වන්දි ගෙවීමේ කාර්යාල පනතේ අනුස්මරණය කිරීම සාමූහික පිළියමක් ලෙස පිළිගෙන ඇති බවත්, මේ වසරේ රට පුරා සැමරුම් රාශියක් සිදු වූ බවත් එහි සඳහන් විය. කෙසේ වෙතත්, OHCHR වෙත ලැබුණු තොරතුරු අනුව, විශේෂයෙන් නැගෙනහිර පළාතේ සැමරුම් උත්සව කිහිපයකට බාධා එල්ල විය. නිදසුනක් වශයෙන්, 2024 මැයි මාසයේදී, සමරු උත්සවයකදී බත් කැඳක් වන ‘කන්ජි’ සංග්‍රහ කිරීම සම්බන්ධයෙන් කාන්තාවන් තිදෙනෙකු ඇතුළු පුද්ගලයින් සිව් දෙනෙකු මහජන සෞඛ්‍ය හේතූන් මත යැයි කියා ත්‍රිකුණාමලයේදී අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබා ගන්නා ලදී.[57] බලහත්කාරයෙන් අතුරුදහන් වූ පුද්ගලයින්ගේ ඥාතීන් සහ තවත් අය විසින් සමරු පැවැත්වීම වැළැක්වීම සඳහා බලධාරීන් අධිකරණ නියෝග ද ලබා ගත්හ.[58] 2024 ජූනි මස අගදී ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද අනුස්මරණය පිළිබඳ විශේෂඥ කමිටුවේ වාර්තාව 2023 අගෝස්තු මාසයේදී ප්‍රසිද්ධියට පත් කරන ලදී.[59] වාර්තාවේ ඇති සොයා ගැනීම් සහ නිර්දේශ, සියලු ප්‍රජාවන්ගේ වින්දිතයින්ගේ පූර්ණ සහභාගීත්වය ඇතිව නව මුලපිරීම් සඳහා වැදගත් පදනමක් විය හැකිය.

39. අතුරුදහන් වූවන් සෙවීමට සහ සොයා ගැනීමට, එහි විධානය සහ පුද්ගලයන් කැඳවීමේ බලතල, බලධාරීන්ගෙන් සහය ඉල්ලීම් සහ පරිශ්‍ර සෙවීම ඇතුළු පුළුල්

---

[56] Ibid.
[57] https://www.hrcsl.lk/wp-content/uploads/2024/05/HRCSL-Press-Notice-21052024.pdf.
[58] https://www.hrw.org/news/2024/05/23/sri-lanka-crackdown-over-civil-war-anniversary.
[59] https://www.presidentsoffice.gov.lk/wp-content/uploads/2024/06/Committee-Report-English.pdf.

විමර්ශන බලතල තිබියදීත්, අතුරුදන්වූවන්ගේ කාර්යාලය (OMP) මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ වින්දිතයන් තක්සේරු කිරීම කෙරෙහි ය.[60] පවුල්වල මූල්‍ය ආධාර සඳහා හිමිකම්, ඔවුන්ගේ දත්ත ගබඩාවේ 'අනුපිටපත් ඇතුළත් කිරීම්' අඩු කිරීම සහ ලිපිගොනු වසා දැමීම ('මූලික විමසීම්' කමිටු හරහා) වැනි කරුණු වලටය. OHCHR මෙම ප්‍රවේශය සම්බන්ධයෙන් අමතර තොරතුරු හෝ සාක්ෂි සැපයීම සඳහා පවුල් මත බර පැටවීම ගැන සැලකිලිමත් වන අතර, එය බොහෝ විට වින්දිතයින් නැවත කම්පනයට පත් කරයි. අතුරුදහන්වූවන්ගේ කාර්යාලය විසින් OHCHR වෙත දන්වා සිටියේ 2002 සිට 2007 දක්වා කාලය තුළ අතුරුදහන්වූවන් 16 දෙනෙකුගේ ඉරණම මේ වන විට තහවුරු කර ඇති බවයි. ඔවුන්ගෙන් 11 දෙනෙකු ජීවතුන් අතර සිටින අතර එක් අයෙකු මිය ගොස් ඇති අතර නඩු හතරක් අධිකරණයේ විභාග වෙමින් පවතී. අතුරුදහන්වූවන්ගේ කාර්යාලය වැඩිදුරටත් ප්‍රකාශ කළේ 'අදියර I' (2000-2021 කාලපරිච්ඡේදය) සිට මේ දක්වා සමාලෝචනය කරන ලද පැමිණිලි 5,791 න් 1,058 ක් හමුදා හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධ බවත්, ඉන් 397 ක වැඩිදුර පියවර ගනිමින් ඇති බවත් සහ ගොනු 50 ක් වැඩිදුර තහවුරු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යවා ඉදිරි ඇති බවත් ය. මෙයට වෙනස්ව, 2024 මැයි මාසයේදී, ශ්‍රි.මා.හි.කො විසින් 2024 මාර්තු මාසයේදී අනුරාධපුරයේදී බලහත්කාරයෙන් අතුරුදහන් විය හැකි වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය.[61]

**40.** OHCHR ගේ දැනුමට අනුව පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවෙන් සමූහ මිනීවළවල් කිහිපයක් අහම්බෙන් සොයා ගෙන අර්ධ වශයෙන් ගොඩ ගෙන ඇතත්,[62] කිසිඳු දේහයක් සාර්ථකව හඳුනා ගෙන ඒවා මිහිදන් කිරීම සහ/හෝ ගෞරවාන්විත අනුස්මරණයක් සඳහා පවුල් වෙත භාරදී නොමැති තරම්ය. මුලතිව්, කොක්කුතොඩුවායි ප්‍රදේශයෙන් සොයාගත් සමූහ මිනීවළක් කැණීමේ සහ ගොඩගැනීමේ පළමු අදියර සඳහා රුපියල් මිලියන 5.7ක් (එ.ජ. ඩොලර් 18,800) 2023 ජූනි මාසයේදී  මුදා හැර ඇති බවත් අතිරේක රුපියල් මිලියන 9.7ක් (එජ ඩොලර් 32,000)  දෙවන අදියර සඳහා වෙන් කර ඇති බවත් රජය වාර්තා කළේය. අධිකරණ වෛද්‍ය පුරා විද්‍යාඥයා විසින් මිනිස් අස්ථි කොටස් 45 ක් සොයා ගන්නා

---

60 Office on Missing Persons Act (2016), sections 12(c)(ii),(d),(e),(g).

61 https://www.hrcsl.lk/wp-content/uploads/2024/05/HRCSL-letter-to-Hon-Attorney-General-on-14-05-2024.pdf.

62https://srilankachrd.org/office/uploads/278.pdf, p.4.

ලදී. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගොඩ ගැනීම් සිදු කිරීමට ප්‍රමාණවත් මූල්‍ය, මානව සහ තාක්ෂණික සම්පත් නොමැති බවට OHCHR කනස්සල්ලට පත්ව සිටින අතර මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහය ලබා ගැනීමට රජය දිරිමත් කරයි.[63]

**41.** සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද සංහිඳියාව පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව සහ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත විශේෂ ඒකකය උතුරු හා නැගෙනහිර පළාත්වල ජනතාව මුහුණ දෙන විවිධ ගැටලුවලට විසඳුම් ලබා දෙමින් සිටින බව ජනාධිපතිවරයා දෙමළ මන්ත්‍රීවරුන් නිතර හමුවී ඇති බවත් රජය වාර්තා කළේය. මෙම මූලපිරීම් නිවැරදි දිශාවේ පියවරකි. මෙම සාකච්ඡාවල ප්‍රතිඵල මෙන්ම මෙම රැස්වීම්වලදී හඳුනා ගත් ගැටලු විසඳීමට එකඟ වූ කාල රාමුව රජය විසින් ප්‍රසිද්ධියට පත් කළ යුතුය.

**42.** 2024 ජනවාරි මාසයේදී රජය 'සත්‍යය, එකමුතුකම සහ ප්‍රතිසන්ධානය සඳහා වූ කොමිෂන් සභාව'ක් සඳහා නීති කෙටුම්පතක් ගැසට් කරන ලදී.[64] 'සත්‍ය හා සංහිඳියා යාන්ත්‍රණය' පිළිබඳ අතුරු ලේකම් කාර්යාලය, උතුරු හා නැගෙනහිර පළාත්වල සහ කොළඹ සිදු කළ සංචාරවලදී උපදේශන 65ක් සිදු කර ඇත. කෙසේ වෙතත්, වින්දිතයින් සහ සිවිල් සංවිධාන, යෝජිත 'සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය' ස්ථාපිත කිරීමට දැඩි ලෙස විරුද්ධ වී ඇති අතර ප්‍රතිසන්ධානය සඳහා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා රජය ප්‍රථමයෙන් නිශ්චිත පියවර ගන්නා ලෙස යෝජනා කර ඇත.[65] තවද, ඉහත සාකච්ඡා කරන ලද ආරක්ෂක අංශ විසින් වින්දිතයන් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම, හිරිහැර කිරීම සහ අත්අඩංගුවට ගැනීම් මගින්, විශ්වසනීය සත්‍ය සෙවීමේ ක්‍රියාවලියක් සඳහා වන මූලපිරීම අඩපණ වේ. ඕනෑම සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් සාර්ථක වීමට නම්, එය පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය භුක්ති විඳිය යුතු අතර වින්දිතයින් සහ පීඩාවට පත් ප්‍රජාවන් සඳහා අර්ථවත් ප්‍රතිඵල අත්කර ගැනීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. වැදගත් කරුණක් නම්, එවැනි සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් සුදුසු පරිදි සැලසුම් කළ යුතු අතර, දේශපාලන හා මිලිටරි බලපෑම්වලින් තොර සහ වෘත්තීය භාවය, ස්වාධීනත්වය, අඛණ්ඩතාව සහ විශේෂඥතාව ඉහළම ප්‍රමිතීන් සපුරාලන කොමසාරිස්වරුන්/වරියන් හෝ විශේෂඥයින් විසින් මෙහෙයවිය යුතුය. එවැනි යාන්ත්‍රණයක් අධිකරණ

[63] See AL LKA/6/2023.
[64] See: AL LKA 7/2023.
[65] https://www.themorning.lk/articles/Uo7wCnlwGcm6pEXOvXZv.

යාන්ත්‍රණයක් වැනි පවතින හෝ අනාගත යාන්ත්‍රණයන්ට යෝග්‍ය සම්බන්ධකම් සහිත විස්තීරණ සංක්‍රාන්ති යුක්තිය උපාය මාර්ගයක කොටසක් විය යුතුය.[66]

**43.** 2024 ජුලි 22 දින, කොවිඩ්-19 කාලය තුළ පනවන ලද අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස විපතට පත් වූ සියලුම ප්‍රජාවන්ගෙන් රජය වෙනුවෙන් සමාව අයැදීමට සහ ආගමික අභිමතය පරිදි මළ සිරුරු භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම පිළිබඳ නීති කෙටුම්පතක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළේය.[67] අනිවාර්ය ආදාහනය ශෝකයෙන් සිටින මුස්ලිම් පවුල්වලට, විශේෂයෙන් ආදාහන ගාස්තුවක් දැරිය නොහැකි දෛනික වැටුප් ලබන දිළිඳු පවුල් සඳහා විශාල මූල්‍ය බරක් සහ ඉමහත් පීඩාවක් ඇති කළ අතර කළේය.[68] 2024 ජූනි මාසයේදී ත්‍රිකුණාමලයේ මුස්ලිම් සිසුන් 70 දෙනෙකුට හිජාබයක් හෝ හිස් ආවරණයක් පැළඳ උසස් පෙළ විභාගයකට පෙනී සිටීම හේතුවෙන් විභාග ප්‍රතිඵල අත්හිටුවීම මුස්ලිම් සුළුතරයට වෙනස් කොට සැලකීමේ රෙගුලාසියක තවත් මෑත කාලීන උදාහරණයකි.[69]

### ආ. මුල් බැසගත් දණ්ඩමුක්තිය

44. සෑම තරාතිරමකමදී අතීතයේ සහ වර්තමාන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන්, විශේෂයෙන් චෝදනා ලබන අපරාධකරුවන් ආරක්ෂක අංශ සාමාජිකයන් වන අවස්ථා වලදී වගවීමක් නොමැතිකම ශ්‍රී ලංකාවේ මූලික මානව හිමිකම් ගැටලුවක් ලෙස පවතී.[70] අපරාධවලට සම්බන්ධ අපරාධකරුවන්ට නඩු පැවරීමට සහ දඬුවම් කිරීමට රාජ්‍යයේ ඇති අකැමැත්ත හෝ නොහැකියාව සංකේතාත්මක නඩුවල අර්ථවත් ප්‍රගතියක් නොමැතිකම මගින් වඩාත් හොඳින් පැහැදිලි වේ. රටේ මෑතකාලීන ආර්ථික අර්බුදයේ මූලික හේතු අතර වූ දූෂණය, බලය අනිසි ලෙස භාවිතා කිරීම සහ පාලන අසාර්ථකත්වය තුළ ද මෙම මුල් බැසගත් දණ්ඩමුක්තිය ප්‍රකාශ වී ඇත.[71]

---

[66] Also see: https://www.hrcsl.lk/wp-content/uploads/2024/01/HRCSL-Press-Notice-HRCSL-letter-to-President-on-17-Jan-2024.pdf.
[67] GoSL's comments on the report, 25 July 2024.
[68] AL/LKA/8/2020.
[69] https://www.hrw.org/news/2024/06/26/sri-lanka-blocks-exam-results-over-muslim-head-coverings.
[70] See also: A/HRC/54/20, para.61; A/HRC/46/20, paras.24–28; A/HRC/49/9, paras.10–19; A/HRC/51/5, para.50.
[71] See: IMF, Sri Lanka Governance Diagnostic Assessment (2023).

**45.** OHCHR වාර්තාවල නැවත නැවතත් ඉස්මතු කරන ලද සිද්ධීන් කිහිපයක්, එනම් 2006 මුතූර්හි මානුෂීය සේවකයින් 17 දෙනෙකු සමූල ඝාතනය කිරීම, 2006 දී ත්‍රිකුණාමලයේදී දෙමළ සිසුන් පස් දෙනෙකු ඝාතනය කිරීම, 2009 දී මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය, සහ 2010 දී මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම වැනි විමර්ශන අදියර තුළ දී දීර්ඝ ප්‍රමාදයන් සහ පසුබෑම්වලට මුහුණ දී ඇත.[72] තවත් සමහරක් ඇඟිලි ගැසීම්, නිදොස් කිරීම් හෝ චෝදනා ඉවත් කිරීමට විෂය වී ඇත. නිදසුනක් වශයෙන්, 2005 දී දේවස්ථානයෙහි පැවැති නත්තල් දේව මෙහෙයකදී සාක්ෂිකරුවන්ට පෙනෙන පරිදි දෙමළ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් ඝාතනය සම්බන්ධයෙන් නීතිපතිවරයා අධිකරණයට දන්වා සිටියේ තමා පැමිණිල්ල ඉදිරියට ගෙන නොයන බවයි. ඉන් අනතුරුව මඩකලපුව මහාධිකරණය වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී සිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් (නොහොත් පිල්ලෙයාන්[73]) ඇතුළු සැකකරුවන් පස්දෙනාම නිදොස් කොට නිදහස් කිරීමට නියෝග කළේය. මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් ද ඇතුළුව ස්වාධීන නඩු පැවරීමේ තීරණ ගැනීමට හැකි වන පරිදි නීතිපතිවරයාගේ කාර්යයට වෙන් වූ ස්වාධීන අභියෝජක අධිකාරියක් සහතික කිරීම සඳහා නීතිපති කාර්යාලය තුළ ප්‍රතිසංස්කරණයක දැඩි අවශ්‍යතාවය මෙම නඩු මගින් අවධාරණය කරයි.

**46.** නඩු විභාග අදියර දක්වා ඉදිරියට ගිය අවස්ථා කිහිපයකදී පවා සැලකිය යුතු පසුබෑම් ඇති වී ඇති අතර, වින්දිතයින්ට වඩාත් සංකේතාත්මක නඩු වලදී පවා යුක්තිය පසිඳලීමේදී බොහෝ විට ජයගත නොහැකි බාධක පෙන්නුම් කරයි. 2008 සහ 2009 වසර වලදී ප්‍රධාන වශයෙන් දෙමළ තරුණයින් 11 දෙනෙකු බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් වන නඩු විභාගය, එහි විත්තිකරුවෙකු වන හිටපු නාවික හමුදාපතිවරයාගේ රිට් පෙත්සමකට අනුව අත්හිටුවා ඇත.[74] 2000 වසරේ අප්‍රේල් මස මිරුසුවිල් ප්‍රදේශයේදී ළමුන් හතර දෙනෙකු ඇතුළු දෙමළ සිවිල් වැසියන් 8 දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධ නඩුවකදී 2015 වසරේ දී හමුදා මාණ්ඩලික සැරයන් සුනිල් රත්නායක වරදකරු කිරීම ශ්‍රී ලංකාවේ වගවීම නොමැතිකමට දුර්ලභ ව්‍යතිරේකයකි. ඔහුගේ වරද 2019 දී

---

[72] See: A/HRC/30/CRP.2, paras.235-9, 1238-41; A/HRC/46/20, para.27.
[73] See: https://www.cpalanka.org/wp-content/uploads/2022/07/AGs-Decision-to-Drop-Charges.pdf; https://www.amnesty.org/en/latest/press-release/2021/01/sri-lanka-collapse-of-joseph-pararajasingham-murder-case-a-failure-of-justice/.
[74] https://www.aljazeera.com/news/2021/10/14/sri-lanka-charges-former-navy-chief-11-killings-civil-war-tamils.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කරන ලදී. කෙසේ වෙතත්, 2020 මාර්තු මාසයේදී එවකට සිටි ජනාධිපතිවරයා විසින් ඔහුට සමාව දෙන ලදී. ජනාධිපති සමාව අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමක් මේ වන විට විභාග වෙමින් පවතී.[75]

47. 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිළිබඳ අපරාධ විමර්ශනයේ ඇත්තේ සීමිත ප්‍රගතියකි. කල්මුණේ, කෑගල්ල, මාවනැල්ල, නුවරඑළිය, පුත්තලම සහ තවත් අධිකරණ කිහිපයක අපරාධ නඩු කිහිපයක් ගොනු කර ඇත. කෙසේ වෙතත්, මෙම නඩු වල ඉතා සුළු ප්‍රගතියක් ඇති අතර, ඒ කිසිවකින් කවරකු හෝ වරදකරුවකු වී නැත. ජනාධිපති විමර්ශන කොමිසමේ සම්පූර්ණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කර නැත. කෙසේ වෙතත්, කතෝලික සභාවට වාර්තාවේ ප්‍රකාශයට පත් නොකළ ඉතිරි කොටස් ලැබී ඇත.[76] මේ අතර, පසු විපරම් විමර්ශනයක් අවශ්‍ය කරන නව විභව සාක්ෂි සහ අභ්‍යන්තර සාක්ෂි අඛණ්ඩව අනාවරණය වී ඇත. රජයට අනුව, වන්දි ගෙවීමේ කාර්යාලය තුළ 'වින්දිතයින්ගේ අරමුදල' පිහිටුවීමෙන් අනතුරුව, ප්‍රතිලාභීන් 196 දෙනෙකුට මූල්‍ය වන්දි ලබා දී තිබේ.[77] කෙසේ වෙතත්, 2023 ජනවාරි මාසයේ සිට හිටපු ජනාධිපතිවරයාට සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුට පුද්ගලිකව වන්දි ගෙවීමට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් නියෝග සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වී නැත.[78] 2024 ජුනි 30 වන විට එම වන්දි අර්ධ වශයෙන් පමණක් ගෙවා තිබුණි. 2024 ජූලි 17 වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද රුපියල් 311,000,000 (එ.ජ. ඩොලර් 1,028,545) න් රුපියල් 134,975,588 (එ.ජ. ඩොලර් 446,393) වගඋත්තරකරුවන්ගෙන් ලැබී තිබුණි. 2024 අගෝස්තු 30 වැනිදාට පෙර සම්පූර්ණ වන්දි මුදල ගෙවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය ජූලි 15 වැනිදා හිටපු ජනාධිපතිවරයාට නියෝග කළේය.

48. 2010 වසරේ වධහිංසා පැමිණවීමට වගකිව යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය නිගමනය කර තිබියදී, 2024 පෙබරවාරියේදී, නව පොලිස්පති ලෙස දේශබන්දු තෙන්නකෝන් ස්ථිර කරන ලදී.[79] පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම ද වාර්තා වූ පරිදි. තෙන්නකෝන් (එවකට කොළඹ උතුර නියෝජ්‍ය

---

[75] https://www.cpalanka.org/fundamental-rights-applications-challenging-the-decision-to-pardon-sunil-ratnayake/.

[76] https://www.dailymirror.lk/worldnews/breaking-news/Received-full-presidential-commission-report-on-Easter-Sunday-attacks%3A-Cardinal/108-280850.

[77] https://reparations.gov.lk/web/images/OR_-_Payments_from_Victim_Fund.pdf.

[78] https://www.reparations.gov.lk/web/index.php?option=com_content&view=category&layout=blog&id=8&Itemid=282&lang=en.

[79] https://www.supremecourt.lk/images/documents/sc_107_2011.pdf.

පොලිස්පති) ප්‍රහාර වැලැක්වීමේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බැවින් විනය ක්‍රියාමාර්ග නිර්දේශ කළේය.[80] ඔහුගේ පත්කිරීමේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් කිහිපයක් ගොනු කර තිබේ.[81] තවද, සන්නද්ධ ගැටුමේදී ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝණය කළ බවට විශ්වාසනීය චෝදනා ලැබුවද, මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න (2019 නොවැම්බර් මාසයේ සිට) ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ලෙස දිගටම කටයුතු කරයි.[82] මෙම පත්වීම් දණ්ඩ මුක්තිය පිළිබඳ හැඟීමක් ශක්තිමත් කරයි; වින්දිතයින්ගේ දුක් වේදනා සහ වගවීම සහ සංහිඳියාව අඩපණ කරයි.

## IV. වගවීම වැඩි දියුණු කිරීම සඳහා තවත් විකල්ප

**49.** ජාත්‍යන්තර නීතිය යටතේ අපරාධ විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සහ වගවීම සහතික කිරීමේ ප්‍රමුඛතම වගකීම ශ්‍රී ලංකා රජය වෙත පැවරේ. අර්ථවත් ප්‍රගතිය සඳහා මූලික පූර්ව කොන්දේසියක් වන්නේ වගවීම නැතිකම සඳහා රාජ්‍යයේ වගකීම පිළිගැනීම සහ යුද්ධයේදී සිදු වූ බරපතල උල්ලංඝනයන් සහ සිදු කරන ලද අපරාධවල අඛණ්ඩ බලපෑම පිළිගැනීමයි.[83] සත්‍යය සහ යුක්තිය සඳහා වූ විස්තීරණ මාර්ග සිතියමක් සමඟ ඒකාබද්ධ ආඛ්‍යානයේ පැහැදිලි සහ ප්‍රසිද්ධ වෙනසක්, බලධාරීන් කෙරෙහි විශ්වාසය යළි තහවුරු කිරීමට දායක විය හැකි අතර එමගින් රට තුළ ඇති ගැඹුරු ධ්‍රැවීකරණයට විසඳුම් සෙවීමට උපකාරී වේ.

**50.** OHCHR විසින් වගවීම ඉදිරියට ගෙන යාම සඳහා සිදු කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් ඉස්මතු කර ඇත.[84] ඒවාට ඇතුළත් වන්නේ, අදාළ විවිධ භූමිකා දරන්නන්ගේ අවශ්‍ය අපක්ෂපාතීත්වය සහ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා පූර්ණ ස්වාධීන නීතිපති කාර්යාලයක් පිහිටුවීම ඇතුළුව ආරක්ෂක අංශයේ සහ අධිකරණ බලධාරීන්ගේ විස්තීර්ණ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක්, රටෙහි බලතල විභේදනය සහ තුලන හා සංවරණ ශක්තිමත් කිරීම, 2015 දී 30/1[85] යෝජනාවෙන් යෝජනා

[80] https://island.lk/church-slams-promotion-of-tainted-officer/.
[81] https://www.cpalanka.org/centre-for-policy-alternatives-cpa-challenges-constitutionality-of-the-appointment-of-inspector-general-of-the-sri-lanka-police-igp/; https://www.newswire.lk/2024/03/14/fr-petition-filed-challenging-appointment-of-igp-deshabandu-tennakoon/.
[82] A/HRC/46/20, para.23.
[83] A/HRC/46/20, para.52.
[84] See: A/HRC/51/5, para.68; A/HRC/46/20, para.52.
[85] A/HRC/30/L.29, para.6.

කර ඇති පරිදි ශ්‍රී ලංකා බලධාරීන් විසින් නිර්දේශ කර මුලින් පිළිගත් විශේෂ උපදේශකයෙකු සහිත අධිකරණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම නැවත සලකා බැලීමය.

51. ක්‍රමානුකූලව දණ්ඩ මුක්තියේ චක්‍රය බිඳ දැමීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවේ අනුපූරක උපාය මාර්ග වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද අපරාධ, ජාත්‍යන්තර නීතිය යටතේ විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට, පිටස්තර සහ විශ්වීය අධිකරණ බලයේ පිළිගත් මූලධර්ම යටතේ අදාළ අධිකරණ බල ප්‍රදේශ අතර අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාවයේ මට්ටම ඉහළ නැංවීම, සියලු විභව අධිකරණ බලයන් භාවිතා කිරීම මෙයට ඇතුළත් වේ. විවිධ රාජ්‍යයන් විසින් ඇතැම් පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග සහ අප්‍රසිද්ධව පවතින සාක්ෂිමය කරුණු පිළිබඳ තොරතුරු හැකිතාක් දුරට රහසිගතව හුවමාරු කර ගැනීමෙන් සහ අනෙකුත් පියවරයන් අතර අධිකරණ සහ අනෙකුත් සහයෝගීතා මාර්ගයන් ශක්තිමත් කළ යුතුය.[86] 43/1 සහ 51/1 මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවන්ට අනුව නිර්මාණය කරන ලද OHCHR දත්ත ගබඩාවේ පූර්ණ විභවයෙන් අදාළ රාජ්‍යයන් තවදුරටත් ප්‍රයෝජන ගත යුතු අතර, අදාළ සාක්ෂිමය ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය සඳහා ඉල්ලීම් කිරීමට අමතරව, ගබඩාවට ඇතුළත් කිරීම සඳහා අදාළ තොරතුරු කල් තියා බෙදා හදා ගත යුතුය. වීසා බලපත්‍ර ලබා දීම සහ අවශ්‍ය වූ විට ස්ථිර නැවත පදිංචියට පහසුකම් සැලසීම යනාදියෙන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අදාළ සැලකිය යුතු තොරතුරු ඇති පුද්ගලයින්ට විදේශයන්හි විමර්ශන බලධාරීන් වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීමට රාජ්‍යයන්ට වැඩිදුර පියවර ගත හැකිය.

52. පුළුල් පරාසයක ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, රාජ්‍යයන්ට ජාත්‍යන්තර නීතියට අනුකූලව, දළ උල්ලංඝනය කිරීම් සහ අපයෝජනයන් සඳහා වගකිව යුතු යැයි විශ්වාස කළ හැකි පුද්ගලයන්ට එරෙහිව වත්කම් තහනම් කිරීම්, සංචාර තහනම් කිරීම් සහ වෙනත් සීමාකාරී ක්‍රියාමාර්ග ඇතුළු ඉලක්කගත සම්බාධක පැනවීම සහ පුළුල් කිරීම සලකා බැලිය හැකිය.[87] ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හෝ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සහ මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් පිළිගත හැකි අන්දමින් සම්බන්ධ වී ඇති ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා විවිධ ආකාරයේ විමර්ශනයන් ද රාජ්‍යයන් විසින් සලකා බැලිය

[86] A/HRC/51/5, para.64(a).
[87] Ibid, para. 64(b).

යුතුය. එක්සත් ජාතීන්ගේ සාම සාධක දූත මණ්ඩල වෙත යෙදවීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිරික්සීමේ ක්‍රියා පටිපාටි දැඩි ලෙස යෙදවීම සහ ද්විපාර්ශ්වික හුවමාරු හෝ පුහුණු අවස්ථා සඳහා සමාන පරීක්ෂාවන් මෙයට ඇතුළත් වේ. උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ බවට විශ්වාසදායක ලෙස චෝදනා නැගී ඇති එවැනි පුද්ගලයින් තානාපති සහ අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩල වෙත ලබා දී ඇති රාජ්‍ය තාන්ත්‍රික වරප්‍රසාද සහ මුක්තිය පිටුපස රැඳී සිටීම වැළැක්වීමට රාජ්‍යයන්ට පියවර ගත හැකිය.[88] මීට අමතරව, වගවීමේ ක්ෂේත්‍රයේ සේවය කරන වින්දිතයින් සහ සිවිල් සමාජ සංවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ බලගැන්වීම සඳහා වන මුලපිරීම්වලට රාජ්‍යයන් සහාය විය යුතුය.[89]

53. තවද, රාජ්‍යයන්ට, බහුපාර්ශ්වික සහ ජාත්‍යන්තර ආයතන සහ සංවිධානවලට ශ්‍රී ලංකා බලධාරීන් කෙරෙහි ඇති ඔවුන්ගේ බලපෑම යොදා ගනිමින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ වගවීමේ හිඩැස් පිළිබඳ සංයුක්ත උත්සුකතාවන් මතු කිරීම සඳහා ද්විපාර්ශ්වික සංවාද වලදී සහ සුදුසු පරිදි මූල්‍ය සහ වෙනත් ආධාර මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සැලසුම් කිරීමේදී ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල සඳහා බලපෑම් කළ හැකිය. අදාළ වන විට, ශ්‍රී ලංකාවෙන් පිටත ඩයස්පෝරා කණ්ඩායම් විසින් සංවිධානය කරනු ලබන අනුස්මරණ මුලපිරීම් සඳහා රාජ්‍යයන් ද සහාය දිය යුතුය.

54. ජාත්‍යන්තර නීති පද්ධතිය, එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතනවල අන්තර් රාජ්‍ය පැමිණිලි යාන්ත්‍රණය[90] තවත් අවස්ථා ලබා දෙයි. ඊට අදාළ මානව හිමිකම් ගිවිසුම් මගින් සලසා ඇති පරිදි ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ නඩු විභාග කිරීම සලකා බැලීම ද අඩංගුය. ශ්‍රී ලංකාව තුළ සිදු වූ අදාළ අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලෙස හැකිතාක් දුරට ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ (ICC) අභිචෝදකයාගෙන් ඉල්ලීමට සිවිල් සමාජ සංවිධාන[91] විසින් උත්සාහ දරා ඇත. රෝම ප්‍රඥප්තිය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලය හරහා නිල වශයෙන් මෙම තත්වය යොමු කිරීම ද ඇතුළුව රාජ්‍යයන්ට ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙහි අධිකරණ බලය සක්‍රිය කිරීමට අවස්ථාව සලසා දෙයි.[92]

---

88 Ibid, para. 64(c).
89 Ibid, para. 64(e).
90 Sri Lanka accepted Human Rights Committee's competence under article 41 of the ICCPR upon ratification on 11 June 1980, and the interstate communication procedure under article 32 of the ICPPED upon ratification on 25 May 2016.
91 See: Rome Statute of the ICC, articles 12–15.
92 Ibid.

55. සිය 46/1 සහ 51/1 යෝජනා හරහා, මානව හිමිකම් කවුන්සිලය තීරණය කළේ, අනෙකුත් දේවල් අතර, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් ද මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සහ ඒ ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් වගවීම ඉදිරියට ගෙන යෑම සඳහා OHCHR හි හැකියාව ශක්තිමත් කිරීමට ය. මේ සඳහා OHCHR විසින් 'OHCHR ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතිය' නමින් විශේෂිත ව්‍යාපෘති කණ්ඩායමක් පිහිටුවන ලදී. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයේ නිත්‍ය අයවැය ද්‍රවශීලතා තත්ත්වය මගින් කණ්ඩායමට සහ එහි කාර්යයට පසුගිය වසර පුරා බලපෑම් එල්ල වී ඇත.

56. 2024 ජූලි 5 වන විට, OHCHR හි ව්‍යාපෘතිය මගින් පිහිටුවන ලද ගබඩාව අයිතම 96,215 කින් සමන්විත වන අතර, ජාත්‍යන්තර සහ බහුපාර්ශ්වික සංවිධාන ඇතුළුව සාක්ෂිකරුවන් 220කට වැඩි සංඛ්‍යාවක් සහ සංවිධාන 250ක් විසින් සපයන ලද තොරතුරු ඇතුළුව විවිධ මූලාශ්‍ර 470කට අධික සංඛ්‍යාවක් අඩංගු වේ. OHCHR අදාළ නීතිරීතිවලට අනුකූලව අදාළ දත්ත කට්ටල හුවමාරු කිරීම සඳහා ප්‍රධාන කාරකයින් සමඟ සම්බන්ධ වීම දිගටම කරගෙන යයි. විවිධ තොරතුරු කට්ටල එකිනෙකට සම්බන්ධ කිරීම, ඉලෙක්ට්‍රොනික දත්ත කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සහ ඩිජිටල් ආරක්ෂිත පරිසරයක් තුළ කෘතිම බුද්ධිය මත පදනම් වූ මෘදුකාංග මෙවලම් අත්හදා බැලීම ඇතුළු නවීනතම විශ්ලේෂණ මෙවලම් භාවිතයෙන් ගබඩාවේ අඩංගු තොරතුරු ප්‍රශස්ත වේ.

57. වාර්තාකරණ කාලය පුරාවට, OHCHR වින්දිතයන් සහ දිවි ගලවා ගත් අය වෙනුවෙන් දිගටම පෙනී සිට ඇති අතර, සිය වරම ක්‍රියාත්මක කිරීමේදී වින්දිතයන් කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක් ඒකාබද්ධ කර ඇත. 2023 දී OHCHR විසින් ශ්‍රී ලංකාව තුළ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල බලපෑම ගවේෂණය කිරීම සඳහා වින්දිතයන් සමඟ උපදේශන මාලාවක් සිදු කරන ලදී. OHCHR, වත්මන් සහ අතීත මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කරන වින්දිතයින්, සාක්ෂිකරුවන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් මුහුණ දෙන අවදානම් පිළිබඳව දැඩි ලෙස දැනුවත් වන අතර, මෙම අවදානම් වලට ප්‍රතිචාර දැක්වීමේ කොටසක් ලෙස, මනෝ-සමාජ සහය ඇතුළු ආරක්ෂක ජාල සහ ආධාරක යාන්ත්‍රණයන් සමඟ සිය හවුල්කාරිත්වය ශක්තිමත් කර ඇත.

58. OHCHR, නීතිවිරෝධී ඝාතන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, වධහිංසා පැමිණවීම් සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් අපරාධ සහ ළමා අයිතිවාසිකම් යන ක්ෂේත්‍රවල විශේෂිත සිද්ධීන්ට ප්‍රමුඛත්වය දෙමින්, උල්ලංඝනය

කිරීම් පිළිබඳ වගවීම සම්බන්ධ විමර්ශන දිගටම කරගෙන යයි. වගකිව යුතු යැයි කියනු ලබන පුද්ගලයන්ගේ පැතිකඩ (Profile -විස්තරය) පුළුල් කර ඇති අතර කණ්ඩායම අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ව්‍යුහයන් සහ ක්‍රියාකාරීන් සිතියම් ගත කර ඇත.

59. OHCHR, එක්සත් ජාතීන්ගේ නීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව අදාළ තොරතුරු සහ සාක්ෂි බෙදා ගැනීම හරහා නිසි අධිකරණ බලය සහිත අධිකරණ සහ අධිකරණ නොවන ක්‍රියාදාමයන් සඳහා අඛණ්ඩව සහාය දක්වයි. මේ දක්වා, OHCHR විසින් නම් කරන ලද පුද්ගලයින් 11 දෙනෙකු සම්බන්ධයෙන් තොරතුරු සහ සාක්ෂි සඳහා ජාතික අධිකාරීන්ගෙන් නිල ඉල්ලීම් ලැබී ඇත. තවද, OHCHR විසින් ක්ෂේත්‍රයේ සිවිල් සංවිධානද ඇතුළුව වගවීමේ සන්දර්භය තුළ අදාළ ක්‍රියාකාරීන් සමඟ අඛණ්ඩ සංවාද පවත්වා ඇති අතර, ප්‍රධාන ක්‍රියාකාරීන් අතර සම්බන්ධතා සහ සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා එහි වරම සහ එය නිර්මාණය කර ඇති ජාලය භාවිතා කරයි.

## නිගමන සහ නිර්දේශ

60. ශ්‍රී ලංකාව ජනාධිපතිවරණයට සහ පාර්ලිමේන්තු මැතිවරණයට ළඟා වන විට, 2022 දී විරෝධතා දැක්වූ ශ්‍රී ලාංකිකයන්ගේ පුළුල් හරස්කඩක් විසින් ඉල්ලා සිටින ලද පරිවර්තනීය වෙනස්කම් සඳහා නැවත කැපවීමට අවස්ථාවක් තිබේ. මැතිවරණ කාලයට පෙර සහ පසුව රජයට වගකීමක් ඇත. එනම් විරෝධතාකරුවන්ට එරෙහිව අනවශ්‍ය හෝ අධික ලෙස බලය යෙදවීමෙන් වැළකීම ඇතුළුව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ආශ්‍රය කිරීමේ සහ සාමකාමීව රැස්වීමේ අයිතිය සම්පූර්ණයෙන් ආරක්ෂා කිරීම සහ ඒවාට ගරු කිරීම, ආගමිකත්වය මත ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් හේතූන් මත  පදනම් වූ භේදකාරී සහ වෙනස් කොට සැලකීමේ වාචාල කතා සහ භාවිතයන් වැළැක්වීමට සහ ඒවාට මුහුණ දීමට පියවර ගැනීම සහ මැතිවරණ ආශ්‍රිත සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජනයන් වැළැක්වීම යනාදියයි.

61. ආර්ථික අර්බුදය සහ ණය බර නිසා සියලුම ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන්ම දුප්පත්ම සහ අවදානම් තත්ත්වන්ට මුහුණ දෙන අනෙකුත් ජන කණ්ඩායම් මත ඇති කරන ගැඹුරු බලපෑම් පිළිබඳව මහ කොමසාරිස්වරයා අවධානයෙන් සිටී. පවතින ගෝලීය ආර්ථික තත්ත්වය සහ ජාත්‍යන්තර මූල්‍ය සැකැස්ම  මගින් ශ්‍රී ලංකාව සහ

අනෙකුත් බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙම ආර්ථික ආතතිය තීව්‍ර වේ. ප්‍රමාණවත් සමාජ ආරක්ෂාවක් සහතික කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් මගින් ආර්ථික ප්‍රතිපත්ති සහ මූල්‍ය ඒකාග්‍රතාවය පිළිබඳ තීරණ මෙහෙයවිය යුතු බව ඔහු ඉල්ලා සිටී. ශ්‍රී ලංකාවේ බාහිර ණය හිමියන් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය අවකාශය රජයට සැපයිය යුතු අතර මූල්‍ය කප්පාදු පියවර මගින් මානව හිමිකම් වගකීම් ඉටු කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව අඩපණ නොවීමට වග බලා ගත යුතුය.

62. වාර්තාකරණ කාල සීමාව තුළ නිරීක්ෂණය වූ නව ප්‍රතිගාමී නීති, ප්‍රජාතන්ත්‍රවාදී තුලන සහ සංවරණ බාදනය, වින්දිතයින්ට, සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට සහ මාධ්‍යවේදීන්ට එරෙහි තර්ජන, බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වයන් සහ අතීතයේ සිදු වූ බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් නැවත හිස ඔසවමින් පෙන්නුම් කරන මූලික නිදහසට අඛණ්ඩව ගරු නොකිරීම ඇතුළුව නැගී එන ප්‍රවණතා ගැඹුරු සැලකිල්ලකට හේතු වේ.

63. වින්දිතයන්ගේ දුක් වේදනා නිශ්චිතව හඳුනා ගැනීමට, දරුණු මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් හමුදාවේ සහ අනෙකුත් ආරක්ෂක හමුදාවන්ගේ භූමිකාව පිළිගැනීමට සහ අතීතයේ සහ වර්තමානයේ සිදු කරන ලද උල්ලංඝනයන් පිළිනොගැනීමට ශ්‍රී ලංකා රජය අසමත් වීම නීතියේ ආධිපත්‍යයට, ප්‍රජාතන්ත්‍රවාදයට සහ යහපාලනයට ප්‍රධාන බාධාවක් වී ඇත. බරපතල අපරාධ සහ මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් පිළිගත හැකි ලෙස සම්බන්ධ වී ඇති බොහෝ ව්‍යුහයන් සහ රාජ්‍ය යාන්ත්‍රණයේ සමහර සාමාජිකයන් ක්‍රියාශීලී ව සිටින අතර, වගවීම සම්බන්ධයෙන් අර්ථවත් ප්‍රගතියක් වළක්වන අතර මානව හිමිකම් කඩකිරීම් අඛණ්ඩව කර ගෙන යයි. 51 වැනි මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේ වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, 2022 දී ආර්ථික අර්බුදයට හේතු වූ සහ මහජන විරෝධතාවලට තුඩු දුන් දූෂණය සහ බලය අයුතු ලෙස භාවිතා කිරීම තුළ ද මුල් බැසගත් දණ්ඩ මුක්තිය ප්‍රකාශ වී තිබේ.

64. මැතිවරණයෙන් පසුව, අලුතින් තේරී පත් වන ආණ්ඩුව, හදිසි අවශ්‍යතාවයක් ලෙස, ගැටුමේ මූල හේතු ආමන්ත්‍රණය කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට සහ දේශපාලන අධිකාරිය බෙදා හැරීමට මෙන්ම වගවීම සහ ප්‍රතිසන්ධානය ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය මූලික ව්‍යවස්ථාමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම ඇතුළත් ජාතික දැක්මක් ශ්‍රී ලංකාව සඳහා අනුගමනය කළ යුතුය.

**65.** වගවීම, ප්‍රතිසන්ධානය, සහ අනාගත මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ බලය අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා මූලික වෙනස්කම් අවශ්‍ය වේ. මෙයට සැලකිය යුතු ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඇතුළත් වන අතර, බරපතල උල්ලංඝනයන්ට සම්බන්ධ වූවන් ඉවත් කිරීම සඳහා පරීක්ෂා කිරීම සහ මානව හිමිකම් ප්‍රමිතීන්ට දැඩි ලෙස අනුකූල වීම සහතික කෙරෙන මෙහෙයුම් සහ අධිකරණ රාමුවක් ස්ථාපිත කිරීම ඇතුළත් වේ. රටේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම, බරපතල උල්ලංඝනයන් නැවත සිදු වීම වැළැක්වීම සහ ප්‍රජාතන්ත්‍රවාදී සහ බලය බෙදා හැර ඇති පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාමය, නෛතික සහ ආයතනික ප්‍රතිසංස්කරණ රජය විසින් සිදු කළ යුතුය. OHCHR මෙම මාවතෙහි ශ්‍රී ලංකාවට සහාය වීමට සූදානම්ව සිටී.

**66.** මානව හිමිකම් කවුන්සිලයේ 46/1 සහ 51/1 යෝජනා යටතේ වගවීම සම්බන්ධ කටයුතු සිදු කිරීම සඳහා OHCHR හි පූර්ණ ශක්‍යතාවට සහාය දීමෙන් සහ එය භාවිතා කරමින් මානව හිමිකම් කවුන්සිලය සහ තනි තනි එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් ශ්‍රී ලංකාවේ වගවීමේ හිඩැස පිරවීමට සහ රට තුළ අර්ථවත් වගවීම සහ ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් සිදු කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි සහ දේශපාලන අධිෂ්ඨානය නිර්මාණය කිරීමට දායක වීම දිගටම කළ යුතුය.

**67. මහ කොමසාරිස්වරයාගේ පෙර වාර්තාවල නිර්දේශ මත රජයට පහත සඳහන් නිර්දේශ ගොඩනගා ඇත.**[93]

**(අ)** කාන්තාවන්ට සහ සුළුතර ප්‍රජාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම, වෛරය සහ ප්‍රචණ්ඩත්වය අවුස්සන ආගමික ක්‍රියාකාරීන්ගේ කතා සහ ක්‍රියා වැළැක්වීම සහ හෙළා දැකීම ඇතුළුව, සියලු දෙනාටම නොවෙනස්ව සැලකීම සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම මත පදනම්ව, ශ්‍රී ලංකාව සඳහා ඇතුළත්කර ගන්නා, බහුත්වවාදී දැක්මක් ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම.

**(ආ)** රජයේ සෑම මට්ටමකදීම නිදහස් හා සාධාරණ මැතිවරණ හරහා දේශපාලන සහභාගීත්වය සඳහා ඇති අයිතිය තහවුරු කිරීම.

**(ඇ)** හමුදාව සතු ඉඩම් නිදහස් කිරීම, උතුරු හා නැගෙනහිර නව ඉඩම් අත්පත් කර ගැනීම් නැවැත්වීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සියලු දිගුකාලීන රැඳවියන් නිදහස් කිරීම සහ වින්දිතයින් සහ අනුස්මරණ මූල පිරීම් නිර්-

[93] A/HRC/46/20,para.60 and A/HRC/49/9, paras.67–69, A/HRC/51/5, paras.70–72; A/HRC/54/20, para.64.

අපරාධකරණය සහ ඒවාට සහාය දීම වැනි විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් සංක්‍රාන්ති යුක්තිය සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම.

(ඇ) මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් පිළිගත හැකි චෝදනා ලබා සිටින අපරාධකරුවන් රජයේ, ආරක්ෂක අංශයේ, හෝ රාජ්‍යතාන්ත්‍රික තනතුරුවල මෙන්ම, විශේෂයෙන්ම සංක්‍රාන්ති යුක්තිය සහ වගවීම සාක්ෂාත් කර ගැනීම සඳහා පිහිටුවා ඇති ඕනෑම ආයතනයක ඉහළ මට්ටමේ තනතුරුවලට පත් කිරීමෙන් හෝ ප්‍රවර්ධනය කිරීමෙන් වැළකීම සහ ඉවත් කිරීම.

(ඉ) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වහාම තාවකාලිකව නැවැත්වීම සහ ඕනෑම ප්‍රතිස්ථාපන නීතියක් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ ත්‍රස්ත විරෝධී නීති සම්පාදනය සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශේෂඥයින් විසින් කලින් දක්වා ඇති මිණුම් සලකුණු වලට අනුකූල බව සහතික කිරීම.[94]

(ඊ) මාර්ගගත ආරක්ෂණ පනත, අයිසීසීපීආර් පනත, රාජ්‍ය නොවන සංවිධාන පනත් කෙටුම්පත සහ විදුලි සංදේශ පනතට යෝජිත සංශෝධන ඇතුළු අදහස් සහ ප්‍රකාශනයේ නිදහස, සමාගමය සහ සාමකාමීව රැස්වීමේ අයිතිය අනවශ්‍ය ලෙස සීමා කරන පවතින නීති හෝ යෝජිත නීති අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම.

(උ) අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, නීති විරෝධී ඝාතන, වධහිංසා පැමිණවීම්, ලිංගික ප්‍රචණ්ඩත්වය සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් තහනම් කර  අතර ඒවා ක්‍රමානුකූලව විමර්ශනය කර දඬුවම් කරනු ලබන බවට හමුදාවේ, බුද්ධි අංශවල සහ පොලිස් බලකායේ සියලුම ශාඛා වෙත ප්‍රසිද්ධියේ නිසැක උපදෙස් නිකුත් කිරීම.

(ඌ) මානව හිමිකම් කඩකිරීම් සහ පසුගිය දශකවල සිදු කරන ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධව අදාළ තොරතුරු තක්සේරු කිරීම සහ නඩු පැවරීමේ ස්වාධීන තීරණ ගැනීම සඳහා නීතිපතිවරයාගේ කාර්යයෙන් වෙන් වූ ස්වාධීන අභියෝජක අධිකාරියක් හදිසි අවශ්‍යතාවක් ලෙස ස්ථාපිත කිරීම.

(ඉ) නීතිය ක්‍රියාත්මක කිරීම, වාණිජ සහ සිවිල් කටයුතු සඳහා හමුදාවේ මැදිහත් වීම වැළැක්වීම සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල හමුදා ස්ථානගත කිරීම සැලකිය යුතු ලෙස අඩු කිරීම.

---

[94] OL/LKA,7/2021.

(ඊ) මානව හිමිකම් ආරක්ෂකයින්, මාධ්‍යවේදීන්, මානව හිමිකම් කඩවීම්වලට ගොදුරුවූවන් සහ ඔවුන්ගේ පවුල්වලට, විශේෂයෙන්ම කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ සෝදිසි කිරීම් සහ හිරිහැර කිරීම් සහ පළිගැනීම් වහාම අවසන් කරන ලෙස සියලුම ආරක්ෂක ආයතන සහ බුද්ධි අංශවලට නියෝග කිරීම.

(එ) අවාසි සහගත සහ කොන් කරන ලද පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල ජීවන තත්ත්වය මත (ආර්ථික) කප්පාදු පියවරයන්ගේ බලපෑම තක්සේරු කිරීම සහ අවම කිරීම; සහ විශේෂයෙන්ම එම පුද්ගලයන් සහ කණ්ඩායම් සඳහා, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ අයිතිවාසිකම්වල එම මූලික අන්තර්ගතය ආරක්ෂා කිරීමට සුදුසු සියලු පියවර ගැනීම.

(ඒ) මානව හිමිකම් භුක්ති විඳීමට දූෂණයේ ඍණාත්මක බලපෑම තක්සේරු කිරීම සහ දූෂණ විරෝධී පියවරයන් මානව හිමිකම් බැඳීම් සමඟ අනුකූල වන බව සහතික කිරීම.

(ඔ) සමාජ ආරක්ෂණ පියවරයන් සමාජ ආරක්ෂණය සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම ඇතුළුව එම පියවර අවාසි සහගත සහ ආන්තික පුද්ගලයන් සහ කණ්ඩායම් වෙත ළඟා වන බව සහතික කිරීම.

(ඕ) ඉඩම් ආරවුල් විනිවිද පෙනෙන, උපදේශනාත්මක, අපක්ෂපාතී සහ වෙනස් කොට සැලකීමකින් තොරව විනිශ්චය කිරීම සහ ආගමික ස්ථාන ඉදිකිරීම පිළිබඳ අන්තර් ආගමික සංවාදය සහතික කිරීම.

(ක)'යුක්තිය' මෙහෙයුම් නවතා, මෙම මෙහෙයුම යටතේ අත්අඩංගුවේ පසුවන සියලු දෙනා නිදහස් කිරීම; මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයින්ට ප්‍රජා මූලික ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ හානි අවම කිරීම සඳහා සහාය ලබා දීම; මානව හිමිකම් සහ ඖෂධ ප්‍රතිපත්තිය පිළිබඳ ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූලව මානව හිමිකම් සහ මහජන සෞඛ්‍ය කේන්ද්‍ර කරගත් අන්තරායකාරී ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ

(ග) බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ 31 වැනි වගන්තිය යටතේ සන්නිවේදනයන් ලබා ගැනීමට සහ සලකා බැලීමට බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ කමිටුවේ නිපුණතාවය හඳුනාගෙන ජාත්‍යන්තර යුද අපරාධ කවුන්සිලයේ (අයිසීසී) හි රෝම ප්‍රඥප්තියට එකඟ වීම.

**68. මානව හිමිකම් කවුන්සිලයට සහ සාමාජික රටවලට අදාළ වන පරිදි මහ කොමසාරිස්වරයා මෙසේ නිර්දේශ කරයි.**

**(අ)** අදාළ ජාත්‍යන්තර ජාල සහ අන්‍යෝන්‍ය නෛතික සහය ක්‍රියාවලීන් හරහා සහ දිවි ගලවා ගත් අය, පවුල් සහ ඔවුන්ගේ නියෝජිතයන් සමග සහයෝගීතාවයෙන් පිටස්තර හෝ විශ්වීය අධිකරණ බලයේ පිළිගත් මූලධර්ම යටතේ ඇතුළුව ජාතික අධිකරණ බල ප්‍රදේශවල අධිකරණ ක්‍රියාදාමයන් හරහා ශ්‍රී ලංකාවේ සියලුම පාර්ශවයන් විසින් සිදු කරන ලද ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලද අපරාධකරුවන් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

**(ආ)** ශ්‍රී ලංකාවේ වගවීම ඉදිරියට ගෙන යාම සඳහා වෙනත් ජාත්‍යන්තර නීතිමය විකල්ප භාවිතා කිරීම සලකා බැලීම.

**(ඇ)** ජාත්‍යන්තර නීතියට අනුකූලව පුළුල් පරාසයක වගවීමේ ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස, දළ ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හෝ බරපතල මානුෂීය නීති උල්ලංඝනය කිරීම් සිදු කළ බවට විශ්වාස කළ හැකි පුද්ගලයන්ට එරෙහිව වත්කම් තහනම් කිරීම් සහ සංචාරක තහනම් කිරීම් වැනි ඉලක්කගත සම්බාධක තවදුරටත් ගවේෂණය කිරීම.

**(ඈ)** පළිගැනීම්වලට මුහුණ දෙන අය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධයෙන් සරණාගත ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සහ වධහිංසා පැමිණවීමේ හෝ වෙනත් බරපතල මානව හිමිකම් කඩකිරීම් පිළිබඳ සැබෑ අවදානමක් ඇති අවස්ථාවන්හිදී බලහත්කාරයෙන් ආපසු සියරට යැවීමෙන් වැළකී සිටීම; සහ

**(ඉ)** OHCHR ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ ඒ ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් වගවීම පිළිබඳ එහි අධීක්ෂණය සහ වාර්තා කිරීම සහ එහි ශක්තිමත් වැඩ කටයුතු කරගෙන යාමට සහාය වීම.

*මෙය නිල පරිවර්තනයක් නොවන බවත් ශ්‍රී ලංකා බ්‍රීෆ් පරිවර්තනයක් බවත් සලකන්න. ඉංග්‍රීසි බසින් ඇති වාර්තාව මෙතැනින් කියවිය හෝ https://www.ohchr.org/en/documents/reports/ahrc5719-situation-human-rights-sri-lanka-comprehensive-report-united-nations හැකිය. පරිවර්තනය සුනන්ද දේශප්‍රිය විසිනි.*